# අරුණෝදය

**Arunodaya**

**ත්‍රෛමාසික පුවත් සංග්‍රහය**

அருணோதயம்

## අන්තර් වාර්ගික ශිෂ්‍ය හුවමාරු වැඩසටහන

ISSN 1800-2935






අරුණෝදය එළඹිණ. ළා හිරුරැස් පිණි බිඳු මත වැටී දිළිසෙන්නට විය. කඳුබිම්, උස් සමබිම් සහ තැනි බිම් සිසාරා නිදහසේ ගලා ගිය අරුණලු දහර නෙතට රසඳුනක් විය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ජාතීන් අතර සහජීවනයට පදනමක් දැමීමේ අරමුණ ඇති ව සැලසුම් කළ අන්තර් පාසල් ශිෂ්‍ය හුවමාරු වැඩ සටහන උස් බිම් තැනි බිම් නො තකා සම ව ගලා ගිය අරුණු දහර පරිද්දෙන් ම සිසු මනස් තුළ දයාව, කරුණාව, අවබෝධය සහ සංහිඳියාව ඇති කරන්නට සමත් විය. එක යායක පිපි, නෙක වර්ණ ඇති එක ම මල් යායක් පරිද්දෙන්, විදුහල් ගණනාවක පැවති මෙම තෙ දින වැඩමුළු මාලාව, විදුහල් බිම් වර්ණවත් කළේ ය.

ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් ඒකකයේ ප්‍රකාශනයක්

# අරුණෝදය

## ත්‍රෛමාසික පුවත් සංග්‍රහය

පළමු මුද්‍රණය 2007 ජනවාරි

ISSN 1800-2935

| | | |
|---|---|---|
| ඡායාරූප | : | සුපුන් මදුසංකේත |
| පරිගණක සැකැස්ම | : | ලිත්මා ග්‍රැෆික්ස්<br>දුරඇමතුම: 011-2708377 ඉ-ලිපි: lithma@sltnet.lk |
| මුද්‍රණය | : | ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස්<br>දුරඇමතුම: 011-2329739 |
| ප්‍රකාශනය | : | විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය<br>ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් ඒකකය |


අරුණෝදය යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජා වැඩසටහන් ඒකකයේ ප්‍රකාශනයකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවාගනු ලැබූයේ මහජන ප්‍රතිපත්තිය පිළිබඳ විවාදයට සිවිල් සමාජයේ දායකත්වය අත්‍යවශ්‍ය මෙන් ම ශක්තිමත් කිරීම අවශ්‍යය යන දැඩි විශ්වාසයෙනි. පර්යේෂණ හා උපදේශක වැඩසටහන් මෙන් ම මහජන සහභාගිත්වය ඔස්සේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රාජ්‍ය පාලනයට හා ගැටුම් සමථයකට අදාළ ප්‍රශ්නවලට සිය අවධානය යොමු කරයි.
අරුණෝදය ප්‍රකාශනය ශ්‍රී ලංකාවේ පාසල්වල උසස් පෙළ සිසු දරුවන් සහ ගුරුවරුන් අතර අන්තර් වාර්ගික සිසු හුවමාරුව පිළිබඳ පැවති සිසු කඳවුරුවලින් ලබාගත් අත්දැකීම්වලින් අංශු මාත්‍රයකි. මෙහි අන්තර්ගත අදහස අවශ්‍යයෙන් ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ අදහස් පිළිබිඹු නොවේ.


වැඩි විස්තර සඳහා

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**
ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් ඒකකය
32/7, මල් පාර, කොළඹ 07.
දුරකථන : 011-2370801-4 ෆැක්ස් : 011-2370802
ඊමේල් cpa@cpalanka.org

# පෙළගැස්ම

ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සංකල්පයෙහි උපත 5

සොඳුරු තෙදිනක මතක 7

විවිධත්වය ඉවසන සමාජයක් ගොඩනගමු 10

මස්කෙළිය බ්ලූම්ෆීල්ඩ් මහා විද්‍යාලයේ සිසු කඳවුර 11

බදුල්ල සාර්නියා දමිළ මහා විද්‍යාලයේ සිසු කඳවුර 22

හැටන් හයිලන්ඩ් විද්‍යාලයේ සිසු කඳවුර 33

අම්පාර ගලහිටියාගොඩ විද්‍යාලයේ සිසු කඳවුර 36

මහනුවර කරගස්කඩ විද්‍යාලයේ සිසු කඳවුර 39

කුරුණෑගල හින්දු දෙමළ මහා විද්‍යාලයේ සිසු කඳවුර 41

අනුරාධපුර වලිසිංහ හරිශ්චන්ද්‍ර විදුහලේ සිසු කඳවුර 42


අනුරාධපුර සහිරා විද්‍යාලයේ සිසු කඳවුර 45

කැටපත් පවුර 46



සහෝදරත්වයේ මතකයන් ....





# ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සංකල්පයෙහි උපත

විවිධත්වය ගරුකරන, සමාජ ආකල්ප වර්ධනය කිරීමේ හා ශිෂ්‍ය සහජීවනය ගොඩනැගීමේ ගුරු පුහුණු වැඩ සටහනක් 2006 අගෝස්තු 27 - 31 දක්වා මහනුවර ටොපෑස් හෝටලයේ දී පැවැත්විණි.

දිවයිනේ විවිධ ප්‍රදේශ හා විවිධ ජාතීන් නියෝජනය කරමින් විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් සියයකට ආසන්න පිරිසක් පාසැල් 49 ක් නියෝජනය කරමින් උක්ත වැඩමුළුවට සහභාගි විය.

අනාගත පරපුර සඳහා නිවැරදි දැක්මක් ඇති කිරීමේ දී ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් ගුරුවරුන් සතුව පැහැදිලි අවබෝධයක් තිබීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් මෙම වැඩමුළුවේදී කටයුතු සැලසුම් කෙරිණි.

මේ වැඩමුළුව සඳහා සම්පත් දායකයන් වශයෙන් එස්.පී.පුංචිහේවා, ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු, ආචාර්ය ආරියරත්න ඇතුගල, මහාචාර්ය කාලිංග ටියුඩර් ද සිල්වා, ආචාර්ය ඞී.නේසයියා, ආචාර්ය වී.අමර්දීන්, සුනන්ද දේශප්‍රිය සහ ශාන්ති සච්තානන්දන් යන අය සහභාගි වූහ.

මේ වැඩමුළුවට සහභාගි වූ සියලු ගුරුවරුන්ගේ මතය වූයේ යුද්ධය ප්‍රතික්ෂේප කළ යුතු බවයි. එමෙන් ම බලය බෙදීමේ සාධාරණ ක්‍රම වේදයක් හරහා ජාතික ප්‍රශ්නයට විසඳුම් ලබා දිය යුතු බව ය.

පාසැල් ආශ්‍රිතව ආකල්ප වෙනසක් ඇතිකර ගැනීමේ මගක් හැටියට ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් මෙහි දී යෝජනා කෙරිණ. විවිධත්ත්වය ගරු කරන මනුෂ්‍ය පරපුරක් බිහි කිරීම එහි තේමාවයි.

වැඩමුළුවේ තුන්වැනි සැසියේ දී අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කර ගත හැකි වඩාත් ප්‍රතිඵලදායී වැඩසටහනක් කෙසේ සකස් කරගත යුතු ද යන්න අවධානයට ලක්විය. ඒ අනුව ශිෂ්‍ය හුවමාරු වැඩසටහන යටතේ දින තුනක කඳවුරක් පැවැත්වීමට එකඟතාවක් ඇති විය.

එම ඒකඟතාවට අනුව සකස් කෙරුණු වැඩ සටහන මෙසේ ය.

## පළමු දින වැඩ සටහන

1. පැමිණීම සහ පිළිගැනීම ප.ව.2.00

1.1 අදාල පාසලේ සිසු දරුවන් සහභාගි වීමට පෙර සහභාගි වන විද්‍යාලයට නාම ලේඛනයක් සහ සහභාගි වන අය පිළිබඳ තොරතුරු මූලික වශයෙන් දැනුම් දිය යුතු ය.

1.2 පැමිණීමට පෙර සිට පෑනේ මිතුරකු හෝ මිතුරියක ලෙස ඔවුනොවුන් අතර හඳුනා ගැනීමක් කළ හැකි නම් වඩාත් ප්‍රයෝජනවත් ය.

1.3 සම්බන්ධීකරණ ආචාර්යවරයා මගින් එක් සිසුවෙක් හඳුන්වා දීමෙන් ඔවුනොවුන් දැක නොතිබුණත් ලිපි හුවමාරු මගින් ඔවුන් හා සම්බන්ධ විය හැකි ය.

1.4 පාසැලට පැමිණි පසු එකිනෙකා පිළිගනු ලබන්නේ පෑනේ මිතුරෙකු හෝ මිතුරියකු ලෙස හඳුනාගත් අයයි. ඇතැම් විට ආරාධිත මිතුරන් හෝ මිතුරියන් දෙදෙනෙකු සිටිය හැකි ය. නමුත් දෙවන සිසු හුවමාරුවේදී සහභාගි විය හැක්කේ එක් අයකු පමණි.

2. පිළිගැනීම

2.1 අදාළ ජාතික, සංස්කෘතික හා ආගමික ස්වරයකින් කළ හැකි ය.

උදා - සිංහල පාසැලක නම් බුලත් කොළයක් දී පිළිගත හැකි ය. දෙමළ පාසැලක නම් පොට්ටුවක් තබා මල් මාලයක් දමා එකිනෙකා පිළිගත හැකි ය.

මුස්ලිම් අය නම් දෑතට දෑත තබා අස්සලා මලේකම් කියා පිළිගත හැකි ය.

2.2 පැමිණි සිසු දරුවන් නේවාසිකාගාර වෙත කැඳවා ගෙන යෑම.

2.3 ප්‍රධාන ශාලාවට පැමිණීම සහ සංග්‍රහයක් කිරීම

3. ආරාධිතයන් සමඟ රැස්වීම පැවැත්වීම
4. හඳුනා ගැනීම
5. විවේක කාලය
6. කණ්ඩායම් නායකයන් තෝරා ගැනීම හා ඉදිරි වැඩ සටහන් සකසා ගැනීම
7. කෙටි චිත්‍රපට නැරඹීම
8. රාත්‍රී ආහාරය

## දෙවැනි දින

1. අවදිවීම
2. ශරීර සුවතා වැඩසටහන හා පෙර දින සමාලෝචනය
3. ආගම සිහි කිරීම
4. උදේ ආහාරය
5. ශ්‍රමදාන කටයුතු - උචිත ශ්‍රමදාන කටයුත්ත කිරීම පාසල සතු ය. අදාල කටයුත්ත සඳහා අවශ්‍ය උපකරණ සපයා ගැනීම ද පාසැල සතු කාර්යභාරයකි.
6. තේ විවේකය
7. ක්ෂේත්‍ර චාරිකාව
8. දිවා ආහාරය
9. සිසු ආකල්ප වර්ධනය පිළිබඳ දේශනයක්
10. ක්‍රීඩා උත්තේජනය
11. විවේකය
12. රාත්‍රී ආහාරය
13. සංස්කෘතික සන්දර්ශනය

## තෙවන දින

1. අවදිවීම
2. ශරීර සුවතා වැඩසටහන හා පෙරදින සමාලෝචනය
3. ආගම සිහි කිරීම
4. උදේ ආහාරය
5. සිහිවටන පැළ සිටුවීම
6. තේ විවේකය.
7. කණ්ඩායම් සාකච්ඡා ඉදිරිපත් කිරීම
8. ඇගයීම හා සමාලෝචනය
9. සමු ගැනීම



අම්/ගලහිටියාගොඩ ම.වි. පැවති කඳවුරේ සිසුවියන් පිරිසක් ක්‍රීඩා පිටියේ විනෝද වූ අවස්ථාවක්

# කළුකර සීත

මැදියම් රැයේ වැටෙන සඳඑළිය
උතුරත්, දකුණත්, කඳුකරයත් මායිම් නොකරයි
ගත සනහා හමන මඳ පවන
ජාති භේදය නොතකයි
වැටෙන කඳුකර සීත දිය ඇලි
උස් පහත් මිටි භේද නොතකයි.
සොබා දහම අප කාටත් පොදුයි
සුළඟ සේ හමා යමු.
සඳ එළිය සේ සිසිල දෙමු.
අවි ලෙලවන යුගය
අවසන් කරමු.

**චන්දන පුෂ්පකුමාර**
අම්/ උහන මහා විද්‍යාලය

## පස්සර දෙමළ මහා විද්‍යාලය

## අන්තර් වාර්ගික ශිෂ්‍ය හුවමාරු වැඩ සටහන

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සංවිධානය කරනු ලබන අන්තර් වාර්ගික ශිෂ්‍ය හුවමාරු වැඩ සටහන යටතේ පැවති ප්‍රථම ශිෂ්‍ය කඳවුර මෙයයි.

අනුරාධපුර හරිශ්චන්ද්‍ර විදුහලේ සිසුන් කණ්ඩායමක් පස්සර දමිළ මහා විද්‍යාලයට කැඳවා ගෙන ගොස්, එම සිසුන්ගේත්, ඔවුන් ජීවත් වන වතු පරිසරයේත්, ජීවන පරිසරය සියැසින් දැක බලාගෙන අත්දැකීම් ලබා ගන්නට සිසුන්ට අවස්ථාව ලබා දීම මෙහි එක් අරමුණක් විය. එමෙන් ම දෙමළ සිසුන් හට, තමන්ට හාත්පසින් ම වෙනස් ජීවන පරිසරයක හැදී වැඩුණු සම වයසේ සිසු පිරිසකගේ අත්දැකීම් බෙදා හදා ගන්නට ලබා දීමෙන් සංස්කෘතික සංහිඳියාව පිළිබඳව අදහසක් ලබා දීම ද තවත් අරමුණක් විය.

ජන වර්ග දෙකකට අයත් මෙම සිසු පිරිස් කණ්ඩායම් හත ලවා විවිධ ක්‍රියාකාරකම් කිරීමෙන් ඔවුන්ගේ නිර්මාණාත්මක හැකියාවන් එළි දක්වන්නට අවස්ථාව ලබා දීමත්, වතු ලැයිම්වල ජීවිතය පිළිබඳ ජීවමාන අත්දැකීම් ලබා දීමත් ආගමික සහ සංස්කෘතික අනන්‍යතාව පිළිබඳ අවබෝධයක් ලබා දීමත් මෙහි දී සිදු කෙරිණ.



පස්සර දෙමළ ම.වි. පැවති කඳවුරේ දී එම විදුහලේ සිසුවියන් විසින් චාරිත්‍රානුකූලව අනු/හරිශ්චන්ද්‍ර ම.වි. සිසුවියන් පිළිගන්නා අයුරු

# සොඳුරු තෙදිනක මතක

වෙනදා මෙන් ම කඳුකරයේ මීදුම් රැල්ල තුනී වෙමින් අරුණාලු කඳු රැල්ල මත පතිත වෙමින් පැවතිණ.

අනුරාධපුර හරිශ්චන්ද්‍ර මහා විද්‍යාලයේ දරු දැරියන් පිළිගන්නට පස්සර මහා විද්‍යාලයේ දරු දැරියෝ සූදානම් වෙමින් සිටියහ. මින් පෙර කිසිදා අසා නැති දැක නැති සම වයසේ සිසු වියන් පිරිසක් පිළිගැනීම ඔවුන්ට විශේෂ අත්දැකීමක් විය.

පිළිගැනීම සිදු වූයේ හින්දු චාරිත්‍රානුකූලව ය. එනම් නළලත රතු තිලකයක් තැබීමෙනි. පිළිගැනීමෙන් පසු ව තේ පැන් සංග්‍රහයකි.

ජාතික ධජය සහ පාසල් ධජ එසවීම සිදු කෙරුණේ ඌව පළාත් සභාවේ සභාපති මානෙල් රත්නායක සහ පස්සර මහ විදුහලේ විදුහල්පති ආරුමුගම් විසිනි. ඉන් පසුව සිංහල හා දෙමළ යන දෙබසින් ම ජාතික ගීය ගායනා කරනු ලැබිණ. ඌව පළාත් සභාවේ සභාපති මානෙල් රත්නායක, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වැඩ සටහන් සම්බන්ධීකාරක ලයනල් ගුරුගේ මහතා සහ විදුහල්පතිවරුන් විසින් පොල්තෙල් පහන දැල්වීමෙන් අනතුරුව උත්සවයේ වැඩ කටයුතු ආරම්භ කෙරිණ.

පළමුව ආගමික අනුශාසනා පැවැත්විණ. දෙවනුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වැඩ සටහන් සම්බන්ධීකාරක ලයනල් ගුරුගේ මහතා විසින් වැඩසටහනෙහි අරමුණු පැහැදිලි කරන ලදි. මානෙල් රත්නායක මහතාගේ දේශනයෙන් පසු ව, සිසු සිසුවියන් හට තම කුසලතා එළි දැක්වීමේ අවස්ථාව උදාවිය.

ඔවුන් ගැයූ ගී සහ කවි හඬින් විදුහල් බිම රසවත් විය.

සිසු කඳවුරේ දෙවැනි අදියර ආරම්භ වූයේ දරු දැරියන් ගේ ශාරීරික ව්‍යායාමවලිනි.

දෙවැනි අදියර වශයෙන් කණ්ඩායම් වෙන් කිරීම සහ ක්ෂේත්‍ර චාරිකාව ආරම්භ විය. පස්වරු 1.00 පමණ වන විට ක්ෂෙත්‍ර චාරිකාව අවසන් ව දරු දැරියෝ පාසලට පැමිණිය හ. දිවා ආහාරයෙන් පසු ව දරුවන්ගේ ක්‍රීඩාවලට අවස්ථාව සැලසිණ.

සන්ධ්‍යා භාගය සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා වෙන් කෙරිණ. කඳවුරේ තෙවැනි දිනය ද ශාරීරික ව්‍යායාම ඔස්සේ ආරම්භ විය. විද්‍යාලයීය ගීත ගායනා කිරීමට සියලු ම දරු දැරියන්ට අවස්ථාව ලැබිණ. අවසන් අදියර ලෙස ලයනල් ගුරුගේ මහතාගේ ඇරයුම අනුව කඳවුරේ දී තමා ලද අත්දැකීම් විස්තර කිරීමේ අවස්ථාවක් දරු දැරියන්ට ලබා දෙන ලදි.

අත්දැකීම් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පස්සර දමිළ මහා විද්‍යාලයේ විදුහල්පති ආරුමුගම් මහතා සමස්ත වැඩ සටහන පිළිබඳ ඇගයීමක් කළේ ය.

සමාලෝචන කතාව කරන ලද්දේ ලයනල් ගුරුගේ මහතා විසිනි.



පස්සර දෙමළ ම.වි. ගුරුවරියන් විසින් අ/හරිශ්චන්ද්‍ර විදුහලේ ගුරුවරියක් පිළිගන්නා අයුරු

# අපට හිතෙන හැටි

## ගොඩක් යාලුයි



අපි මේ වගේ ගමනක් ආවෙ පළමු වතාවට. කවදාවත් නො දැකපු අය උනත් අපි මේ අය එක්ක ගොඩක් යාලු වුනා. මේ කඳවුර අපට ලොකු අත්දැකීමක්

**- ගයාන් ඉන්දික**

## දාලා යන්න බෑ



අපි එනකොට ආවෙ එච්චර කැමැත්තකින් නොවෙයි. නමුත් දැන් අපිට මේ අය දාලා යන්න හිතෙන්නේ නෑ. ඒ තරමට ම අපි මේ අයත් එක්ක යාලු යි.

**- විමුක්ති සේනානායක**

## වගකීම



අපි මේ අයගේ ගෙවල් බලන්න ගියා. ගෙවල් වෙනුවට තියෙන්නෙ කුඩා කාමර. එක කාමරයක නව දෙනෙක් හිටියා. ඒ අය ගොඩක් දුකෙන් ජීවත් වන්නේ, ඒ අයට ගෙවල් සාදලා දෙන එක රජයේ වගකීමක්.

**- පැතුම් චාමර**

## බෙදීමක් නෑ



ඊයේ අපි දවස පුරා ම මෙහෙ ඇවිද්දා. අපියි මේ අයයි අතර ගොඩක් වෙනස්කම් තියෙනවා. ඒත් අපි ඔක්කොම මිනිස්සු නිසා සමාන යි. අපට බෙදීමක් අවශ්‍ය නෑ.

**- සංජීව සම්පත්**

## වැටුප් මදි



මේ අයගේ දෙමාපියන්ට තියන ලොකුම ප්‍රශ්නය වැටුප් ප්‍රශ්නය. දවසකට ලැබෙන්නේ රු. 200/-කටත් අඩු මුදලක්. ඒකෙන් ජීවත් වන්නේ කොහොමද? ඒක හරි අපරාධයක්.

**- මනෝජ් සරත්**

## අධ්‍යාපනයක් නෑ



ඊයේ අපි මේ ජනතාවගේ ජීවන තත්ත්වය ගැන දැන ගත්තා. එක පවුලක පාසල් නොයන ළමයි හතර දෙනෙක් හිටියා, මේ වගේ කඳවුරුවලට ඒ ළමයිනුත් සම්බන්ධ වනවා නම් හොඳයි. ඒ අයටත් අධ්‍යාපනයක් ලැබිය යුතුයි.

**- සමන්ත විජේසිංහ**

## සංස්කෘතිය ගැන දැන ගත්තා



අපි මේ අයගේ සංස්කෘතිය ගැන ඉගෙන ගත්තා. අපි මේ අය සමග දුක, සතුට බෙදා ගත්තා. අපි සංචාරය කළේ අම්නි තේ වත්තේ. අපි කදිරේෂන් කෝවිලටත් ගියා. හින්දු ආගමේ චාරිත්‍ර දැන ගත්තා. මේ මිනිස්සු වහල්ලු වගේ වැඩ කරන්නේ. ඒ අයගේ ශ්‍රමය හූරා ගෙන කනවා. මේ දුක්බර තත්ත්වයෙන් ඔවුන් මුදවලා යහපත් ජීවන තත්වයක් ලබා දිය යුතු යි.

**ඉසංකා දුලාංජලී**

# අනාගතයට සැලසුම්

ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
**කේ. එම්. ජයසූරිය**

සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව සහජීවනයෙන් ජීවත්වන ප්‍රදේශයක් හැටියට පස්සර හැඳින්විය හැකියි. එ වැනි ප්‍රදේශයක මෙවැනි වටිනා වැඩ සටහනක් ආරම්භ කිරීම ගැන සතුටු වෙනවා.

ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ ශ්‍රම සම්පතින් තවමත් නිසි ප්‍රයෝජන ගෙන නැහැ. ඒ සඳහා පැහැදිලි දර්ශනයක් අනුව අනාගතය සැලසුම් කළ යුතු යි. අනාගත සංවර්ධනයේ පදනම වන්නේ දරු පරපුර යි. ඔවුනට පත පොතේ දැනුම මෙන් ම විවිධත්වය ගරු කිරීම වැනි මානුෂික ගුණාංග ඇති කිරීමට මේ වැඩ පිළිවෙළින් සහයෝගයක් ලැබෙනවා. සාමය ඇති කිරීම සඳහා අධ්‍යාපන ප්‍රඥප්තිය ඔස්සේ ගත හැකි පියවර ගැනීමට පූර්ණ සහයෝගය ලබා දෙනවා.



පස්සර දෙමළ ම.වි. පැවති කඳවරේ දී සියලු දෙනා එක් ව ක්‍රීඩාවේ නිරතවන අයුරු



# විවිධත්වය ඉවසන සමාජයක් ගොඩනගමු

ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශයේ
**ලයනල් ගුරුගේ**

මීට ටික කලකට පෙර මොණරාගල ප්‍රදේශයෙහි පාසලක දී පැවති සම්මන්ත්‍රණයක් අමතමින් සිටි මම එම සිසුන්ගෙන් එක් ප්‍රශ්නයක් ඇසීමි.

''ඔබට දෙමළ මිතුරන් කී දෙනෙක් ඉන්නවද?''

ඒ මා ඇසූ ප්‍රශ්නයයි. එහෙත් කිසිවකුගෙන් එයට සතුටුදායක පිළිතුරක් ලැබුණේ නැත. මේ පිළිබඳ ව මම බොහෝ දුරට කල්පනා කළෙමි. අපේ රටේ, භාෂාමය සහ සංස්කෘතිකමය විවිධත්වය, තේරුම් ගැනීමත් එයට ගරු කිරීමත් සම්බන්ධයෙන් ළමා සිත් තුළ හැඟීමක් ඇති කිරීමට වැඩිහිටි පරපුර සමත් වේ නම් අනාගත වැඩිහිටියන් ගැටුම්කාරී ක්‍රියාවන්ට තල්ලු වී යෑම වළක්වාගත හැකි නොවේද යන හැඟීම මසිත ඇති විය.

මේ වැඩසටහන සඳහා අවස්ථාව ලැබුණේ මා නිසා හෝ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිසා නොව ගුරුවරු, අධ්‍යාපන අධ්‍යක්ෂවරු, විදුහල්පතිවරු යනාදී වශයෙන් විවිධත්වයට ගරු කිරීම පාසල් වියේ දී ම පටන්ගත යුතුය යන අදහස අනුව ප්‍රායෝගික වැඩපිළිවෙළක් සඳහා අවතීර්ණ වූ යහපත් මිනිසුන් පිරිසක් හේතුවෙනි.

ළමා වියේ දී ඇති කෙරෙන යහපත් ආකල්ප ඔවුන්, ආදි සිසුන් වූ පසුවවත් දිගට පවතීය යන්න මාගේ හැඟීමයි. දකුණු පළාතේ වෙසෙන ජනතාවගෙන් 99%කට දෙමළ භාෂාව කථා කළ නොහැක. මේ කණගාටුදායක තත්ත්වය ජාතීන් දෙක අතර අන්‍යොන්‍ය සහජීවනය සඳහා විශාල බාධකයක්ව පවතී.

සිංහල, දෙමළ, මුස්ලිම් සහෝදරත්වය ඇති කිරීම සඳහා මුල් අඩිතාලම දැමිය යුත්තේ කුඩා කල පටන් ය.

මෙය මිනිස්කම සොයායන ගමනකි. මේ රටේ අනාගතය බාර ගන්නේ ඔබ ය. දින තුනක කඳවුරු ජීවිතයේ දී ඔබ ඉගෙන ගන්නා වටිනාම පාඩම වනුයේ භාෂාව සහ ආගම වශයෙන් වෙනස් වුවත් අපි එක වගේ මිනිසුන්'' යන්නයි.

අප අතර වෙනස්කම් පවතී. කිසිවකු කිසිවකුට සමාන නොවේ. ශාරීරිකව ඇති වෙනස්කම් මෙන් ම සමාජ හා සංස්කෘතිකමය වශයෙන් වෙනස්කම් පවතී. ඒ වෙනස්කම්, ඉවසීමට, පිළිගැනීමට හා ඊට ගරු කිරීමට අපට හැකි විය යුතු ය. සිංහල දරුවා තම සිංහලකමට කැමති අයුරින් ම දෙමළ දරුවා ද තම දෙමළකමට කැමති ය. මුස්ලිම් දරුවා තම මුස්ලිම්කමට කැමති ය. මෙසේ හෙයින් මේ කිසිදු ජාතියකට අයත් දරුවකු අනෙකුත් ජනවර්ගවලට අයත් දරුවන් පිටස්තර නොකළ යුතු ය. ඔවුන්ට ගරු කළ යුතු ය. ආදරය කළ යුතු ය. ඔවුන් අවබෝධ කරගත යුතු ය.

ඔබේ ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී වතුකරයේ ජන ජීවිතය ගැන ඔබ බොහෝ දේ ඉගෙන ගන්නට ඇත. ඒ අතරම ඔවුන් සමග සුහද බැඳීමක් ද ඇතිවන්නට ඇත. මේ සුහදත්වය අනාගතය දක්වා පැවතිය යුතු ය. මේ වැඩමුළුව අවසන් වන විට දෙමළ දරුවා සිංහල මිතුරන්ගේ නම් පනහක්වත් දැන සිටිය යුතු ය. සිංහල දරුවා දෙමළ මිතුරන්ගේ නම් පනහක්වත් දැනගෙන සිටිය යුතුයි. අපේ රට යුද්ධයකට ගොදුරුව තිබෙන්නේ අප අතර ඇතිවිය යුතුව තිබූ සහජීවනය අහිමි වී යෑම හේතුවෙනි.

විවිධත්වයට ගරු කිරීම සහ ඉවසීම වැඩිහිටි පරපුර අතින් බැහැරව ගිය හෙයිනි. එහෙයින්, ඔබ මෙයින් උකහාගත් මනුස්සකමේ පණිවුඩය, සෑම විදුහලක් හරහා ම සෑම ගමක් හරහාම සෑම හදවතක් හරහාම පැතිරවීමේ වාසනා ගුණය ඔබ සතුව පවතී. එය ක්‍රියාවට නැංවීමේ භාග්‍යය අප කාටත් අත් දකින්නට ලැබේවායි පතමු.

# මස්කෙළිය බ්ලූම්ෆීල්ඩ් මහා විද්‍යාල කඳවුර

## 2006 ඔක්තෝබර් 6

කතුහලයෙන් ද ප්‍රාර්ථනාවලින් ද මන්දස්මිතයෙන් ද පිබිදුණු දෑස් සියගණනක්, විදුහලෙන් එපිට මහ මග දෙසට යොමුව වී පැවතිණ. විටෙක සිරි සිරි ගා ඇද හැලෙන සිහින් සිරි පොද වැස්ස ය. තවත් විටෙක දැඩි අව් රැස් ය. බ්ලූම්ෆීල්ඩ් සිසු සිසුවියන් මී මැසි පොදියක් මෙන් ඉහිරෙමින් ද රංචු ගැසෙමින් ද සිටිය දී ඇතුගල්පුර දෙසින් නික්ම ආ තවත් එබඳුම මී මැසි රංචුවක් බ්ලූම්ෆීල්ඩ් විදුහල් බිම වෙත සේන්දු වනු පෙනිණ.

වෙලාව පස්වරු 4.00 පමණ වන්නට ඇත.

කිසි දා පහස විඳ නැති බ්ලූම්ෆීල්ඩ් විදුහල් බිමෙහි ඇතුගල් පුර දරුවන්ගේ පා ගැටෙන මොහොත අසිරිමත් දසුනක් මවා පෑවේ ය.




මස්කෙළිය බ්ලූම්ෆීල්ඩ් විදුහල් කඳවුරට පැමිණෙන ඇතුගල්පුරයේ ආරාධිත සිසු සිසුවියන් බ්ලූම්ෆිල්ඩ් විදුහලේ සිසු සිසුවියන් විසින් පිළිගත් අවස්ථාව

ඇතුගල්පුර දරුවන්ගේ ගෙලෙහි මල් මාලා පැළඳවිණ. ඔවුන්ගේ නළලතෙහි රතු තිලක තබන ලද හ. ඒ රතු තිලකය විෂ ධූමයෙන් දූෂිත නොවූ නොදරුවන් ගේ හද පත්ලෙන් උපන් සෙනෙහසෙහි සංකේතයක් වැන්න.

ගොකරැල්ල මහ විදුහල්පති සහ මැදගම විදුහල්පති විසින් ජාතික කොඩිය එසවීමෙන්, කඳවුර නිල වශයෙන් ආරම්භ කෙරිණ. සිංහල සහ දෙමළ භාෂා දෙකින් ම ජාතික ගීය ගායනා කරනු ලැබිණ. සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දැල්වීම සිදු කෙරුනේ ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් ඒකකයේ අංශ ප්‍රධානී ලයනල් ගුරුගේ 'UPSAC' කඳුරට සමාජ ක්‍රියාකාරී සංවිධානයේ විධායක අධ්‍යක්ෂ එස්. සන්දනම්, අඹගමුව ප්‍රා. සභාපති නගුලේශ්වරන්, බිලුම්ෆීල්ඩ් දමිල මහා විදුහල්පති පරමේශ්වරන්, කුරුණෑගල හින්දු විදුහල්පති සිවඥානම්, මැල්සිරිපුර මැදමුල්ල මහා විදුහලේ විදුහල්පති, ගොකරැල්ල මහ විදුහල්පති, බිලූම්ෆීල්ඩ් දමිළ මහ විදුහලේ ආචාර්ය සරවනභවන කුමාර, මස්කෙළිය ශාන්ත ජෝශප් විදුහලේ ආචාර්ය චන්ද්‍රසේකරම්, අඹගමුව ප්‍රා. සභා මන්ත්‍රී සිවසුන්දරම්, වීරකේසරී පුවත්පතේ වාර්තාකරු පී. පන්ගම්, කු/දිස්ත්‍රික් වැඩ සටහන් සම්බන්ධීකාරී සී. තිලකා හේරත් සහ ශිෂ්‍ය නියෝජිත දෙපළක් ද විසිනි. පිළිගැනීමේ කතාවෙන් පසු ව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වැඩසටහන් කළමනාකරු ලයනල් ගුරුගේ විසින් වැඩ සටහනේ අරමුණ පැහැදිලි කරන ලදි.

ඊළඟට අදහස් පළ කළේ බිලුම්ෆීල්ඩ් විදුහල්පතිවරයා ය.

ඔහු මෙසේ ද පැවසී ය.

''ලොව සියලු ආගම්වල හරය වන්නේ කරුණාව, මෛත්‍රිය සහ දයාවයි. අප රට ගොඩනැගිය හැක්කේ එම ගුණාංග මත පිහිටා කටයුතු කිරීමෙනි. ස්ථිරසාර සාමයක් ඇති කිරීම සඳහා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය සහ රනිල් වික්‍රමසිංහ මහතා යම් යම් උත්සාහයන් දැරූ අතර, මහින්ද රාජපක්ෂ මහතා ද යම් උත්සාහයක් දරනු පෙනේ. අපි එම උත්සාහයන්ට සහාය පළ කරමු. රටේ ජාතික අර්බුදය විසඳීමේ එකම මග සාම වැඩ පිළිවෙළ සක්‍රීය කිරීම බව අපගේ විශ්වාසයයි.''

''කුරුණෑගලින් මස්කෙළියට ලැබෙන්නේ බත්
මස්කෙළියෙන් කුරුණෑගලට ලැබෙන්නේ තේ.''

එසේ පවසමින් දෙපළාත අතර ඇති ආර්ථික සංහිඳියාව මතු කළේ ශාන්ත ජෝශප් විදුහලේ ආචාර්ය චන්ද්‍රසේකරන් විසිනි. සියලු ම ජාතීන්ට අයත් දරුවන්ට සමගියේ වැදගත්කම පෙන්වා දෙන මෙ වැනි වැඩ සටහන් අගය කළ යුතු බව මැදමුල්ල විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිවරයා ප්‍රකාශ කළේ ය. බිලුම්ෆීල්ඩ් මහ විදුහලේ ආචාර්ය සරවන බවන කුමාර මහතා විසින් සමාරම්භක උළෙලේ ස්තුති කතාව පවත්වන ලදි.

අලුතින් හඳුනාගත් මිතුරු මිතුරියන්ගේ අල්ලාප සල්ලාප මැදින් තේ පැන් රසවිඳීමේ අවස්ථාව ඉන් පසු එළඹිණ.

ඉන් අනතුරුව ශිෂ්‍ය හුවමාරු වැඩ සටහන පිළිබඳව සිසුන්ට අවබෝධයක් ලබා දීම සිදු කෙරුණේ රවි චන්ද්‍රලාල් සහ සෙන්දිල් සිවඥානම් විසිනි. රාත්‍රී ආහාරයට පෙර කඳවුරු බිම කොවුලු කෙව්ලියන්ගේ ගී නදින් කුල්මත් වූයේ, ගී ගැයීමේ අවස්ථාවක් ඔවුනට ලබා දුන් හෙයිනි. ගී ගැයීම සඳහා ඇදුරු මඬුල්ල ද හවුල් විය.

කඳවුරේ දෙවැනි දිනයෙහි ප්‍රථම අංකය වූයේ ශාරීරික ව්‍යායාම යි. ක්ෂෙත්‍ර චාරිකා එහි දෙවැනි පියවරයි. ක්ෂත්‍ර චාරිකාවෙන් පසු ව දිවා ආහාරය සඳහා අවස්ථාව ලැබිණ.



මස්කෙළිය බිලූම්ෆීල්ඩ් විදුහලේ පැවති සිසු හුවමාරු කඳවුරේ සංස්කෘතික සංදර්ශනය වර්ණවත් කළ බිලූම්ෆීල්ඩ් විදුහලේ සිසුවියෝ

ඉන් අනතුරුව ගුණසේකර ගුණසෝම ගේ මෙහෙයවීමෙන් ශ්‍රී ලංකාවේ ජන සාහිත්‍ය පිළිබඳ ව හැඳින්වීමක් සිදු කෙරිණ. සෙන්දිල් සිවඥානම් මහතා පරිවර්තනයෙන් සහාය විය. ජන සාහිත්‍ය ඔස්සේ පිළිබිඹු වන ජන විවිධත්වය සහ ජන සංහිඳියාව මෙහිදී විශේෂ අවධානයට ලක් විය. ගුණසේකර ගුණසෝමයන් විසින් සිසු අවධානයට ලක් කරන ලද ජන කවියක්




බ්ලූම්ෆීල්ඩ් විදුහල් සිසුවියන් පිරිසක් නර්තනයේ යෙදෙමින්...

තලයිම් තල මුඩියුම් කිතුලක මල සේමා
උඩයිම් නඩයිම් රණ ගිරවිගේ තුඩ සේමා

කයිල වන්නියෙන් ආ දැයි දෙමළ පැටී
ඉනෙන් බඩෙන් කොණ්ඩෙන් ලස්සයක් වටී
ඉනට රෙද්ද ඇතිවා නම් රටක් වටී
දෙවියෝ රැක දෙවන් මා දුටු දෙමළ පැටී

දෙමළ ලියේ නුඹ බාසේ නො බාසේ
ගින්දර වැන්න නුඹ අදිනා සරාසේ
රත්තරනට පිත්තල එක් වුණා සේ
දෙනව ද ලඳුනෙ දිය බොන්නට තිබාසේ

උස් පිල පිට කුකුළු රාළ පායි කොණ්ඩුවා
පායි කොණ්ඩුවා මහ ලේ පායි කොණ්ඩුවා
සෙම්බුවකට වතුර දමා තන්නි කොණ්ඩුවා
තන්නි කොණ්ඩුවා මගලේ තන්නි කොණ්ඩුවා




**ගුණසේකර ගුණසෝම මහතා**
ප්‍රවීණ ජනශ්‍රැති පර්යේෂක හා ලේඛක

පිඟානකට බත් බෙදලා සෝරූ කොණ්ඩුවා
සෝරූ කොණ්ඩුවා මගලේ සෝරූ කොණ්ඩුවා
කුල්ලකට නෙල්ලි දමා සුළඟු කොණ්ඩුවා
සුළඟු කොණ්ඩුවා මගලේ සුළඟු කොණ්ඩුවා

සිහිනිඟලු රන් දුනු මිට ලූ කළ වායා ගෑ රන් රඹ පැළලු
දෙපතුළ වූ සකි සුවිපුල ලූ දසැඟිලි බැබලූ රන් පලු සරුලූ
කෙවිළිය ලූ හඬ නඳ කිඳුරූ මා දැක තෙපලු මුව රළ මුකුලූ
මල් මඳ ලූ සුරඟන වටිලූ සකියොන් කතලූ පොතුවිල සිටිලූ

මෙසුරඟනා දුටු යුග නෙතිනා එන කඳුළු තනා තුන්යම ඉඳනා
මිතුරූ දෙනා සැම දෙන විසිනා ලඳ සරණා ලැබුණොත් මෙදිනා
දනසකිනා මිණි බරණතනා කර පළඳමිනා ඇගේ සිතු ලෙසිනා
රට වටිනා රන් මාල තනා රන් දහසකිනා රන් එල්ලමිනා

ලඳුනේ වරලස පීරා බඳිනට දෙක්ක්ඳයි කැඩපත් ගෙන්නාලා
ලඳුනේ පියයුරූ නෙතලූ බැඳුමට දෙක්ක්ඳයි රන් විටි ගෙන්නාලා
ලඳුනේ තුනු ඉඟ නෙතලා ඇඳුමට දෙක්ක්ඳයි ඔලියල් ගෙන්නාලා
ලඳුනේ කළු ලඳ මා වෙත සිටියට දෙක්ක්ඳයි සන්නස් ලියවාලා

මෙබඳු ජන ගී නිදර්ශනාත්මක ව සාකච්ඡා කිරීම ජාතීන් අතර සංස්කෘතික සංහිඳියාව පිළිබඳව සිසුනට නවමු අත්දැකීමක් විය.

(ගුණසේකර ගුණසෝමයන්ගේ පානම්පත්තුවේ ජනකවි කෘතියෙන් උපුටා ගන්නා ලද්දකි.)

ඉනික්බිති ව විවිධ ක්‍රීඩා ඉසව්වලට සහභාගි වීමේ අවස්ථාව සිසුනට ලැබිණ.

ප.ව. 7.30ට පමණ බිලුම්ෆීල්ඩ් විදුහල් සිසුවියන්ගේ පිළිගැනීමේ නර්තනයෙන් ආරම්භ වූ සංස්කෘතික සන්දර්ශනය බෙහෙවින් ආස්වාදජනක අවස්ථාවක් විය. කඳවුරේ තෙවැනි දින, ප්‍රධාන රැස්වීම් ශාලාවේදී සිසු කණ්ඩායම්වලට තම අදහස් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලැබිණ.

## ලොකුම අත්දැකීම

**චින්තක විමලසේන**



මගේ මුළු පාසල් ජීවිත කාලයේ දී පුළුල්ම අත්දැකීමක්. දමිළ, මුස්ලිම් මිතුරන් හඳුනාගන්නට ලැබුණේ පළමු වරටයි.

## අමතක වන්නේ නෑ

**සමීර ලක්මාල්**



අපේ හිත්වල මනුස්සකම අපි බෙදා ගත්තා. එකතුවෙලා ජීවත් වෙන හැටි ඉගෙන ගත්තා. මේ අත්දැකීම් කවදාවත් අමතක වන්නේ නෑ. එය ජීවිතයට ඉතා ම වැදගත්.

## දුෂ්කර ජීවිතයක්

**නිලුකා දමයන්ති**



වතුවල ජීවත්වන අයගේ දුෂ්කර ජීවිතය අපි දැක්කා. ඔවුන්ට දිනක වැටුප හැටියට ලැබෙන්නේ රු. 140යි. ඒකෙන් ජීවත් වෙන්නේ කොහොමද කියලා හිතාගන්න බෑ.

## සාමය ලබා දේවි

**ෆර්ෂාන්**



පාලි රජ්ජුරුවෝ මේ දින දෙකේ දී අපට ගොඩක් දේවල් කියලා දුන්නා. ඒ විදියටම අපට ඉක්මනින් ම සාමය ලබා දෙයි කියලත් විශ්වාස කරනවා.

සිසුන්ගේ අදහස් දැක්වීම්වලින් අනතුරු ව ශාන්ත ජෝශප් විදුහල, සත්කාරක බිලුම්ෆීල්ඩ් විදුහල, මැදමුල්ල මහ විදුහල ගොකරැල්ල මහ විදුහල සහ හින්දු විදුහල නියෝජනයකරමින් එහි ආචාර්යවරු කිහිප දෙනෙක් ද, කුරුණෑගල කාන්තා සංවර්ධන පදනමේ දිස්ත්‍රික් සම්බන්ධීකාරිකා තිලකා හේරත් ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙනුවෙන් ලයනල් ගුරුගේ මහතා ද කතා පැවැත්වීමෙන් අනතුරුව බිලුම්ෆීල්ඩ් විදුහලේ සරවනබවන කුමාර මහතා ස්තුති කතාව කළේ ය. වැඩ සටහනෙහි අවසන් අංකය හැටියට සාමයේ ගීත දෙකක් ගායනා කෙරිණ.



බිලුම්ෆීල්ඩ් විදුහලේ පැවති කඳවුරේ දී සිසු සිසුවියන් පිරිසක් ක්‍රීඩාවේ යෙදෙන අයුරු



ඇතුගල්පුරයේ පාසල්වලින් පැමිණි සිසු සිසුවියන්, බ්ලූම්ෆීල්ඩ් විද්‍යාලයේ සහෝදර සහෝදරයින්ට සමු දෙමින්...

## අප ආදර්ශයක් විය යුතුයි.

අඹගමුව ප්‍රාදේශීය සභාවේ සභාපති
**නගුලේෂ්වරන් මහතා**



අඹගමුව ප්‍රාදේශීය සභාව, සිංහල මන්ත්‍රීවරුන් මෙන්ම දෙමළ මන්ත්‍රීවරුන් ද නියෝජනය කරනවා. පසුගිය අවස්ථාවක, ගිනිගත්හේන සිංහල ගම්මානවල සංවර්ධන කටයුතු සඳහා රුපියල් ලක්ෂ විස්සක ප්‍රතිපාදන ලැබුණා. නමුත් දෙමළ මන්ත්‍රීවරුන් හැටියට අප දෙමළ ගම්මාන සංවර්ධනය කිරීම සඳහා මුදල් නොලැබීම සම්බන්ධයෙන් විරුද්ධ වුණේ නෑ. ලැබුණු මුදල් සිංහල ගම්මානවල සංවර්ධන කටයුතුවලට යෙදවීමට අප සහයෝගය ලබා දුන්නා. නමුත් සිංහල මන්ත්‍රීවරුන් මෙහි දී සිංහල ගම්මාන සඳහා රුපියල් ලක්ෂ 10 කුත් දෙමළ ගම්මාන සඳහා රුපියල් ලක්ෂ 10 කුත් යෙදවීමට සාකච්ඡා කළා.

ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයන් වශයෙන් අප ජාති, ආගම් හෝ කුල භේද නොසලකා එකමුතුව කටයුතු කිරීමෙන් රටේ අනෙක් ප්‍රාදේශීය සභාවන්ට ආදර්ශයක් සපයා තිබෙනවා.

භේද තුරන් කළ හැක්කේ අවංකව හා ප්‍රායෝගිකව ඒ සඳහා කැපවීමෙන් මෙම ශිෂ්‍ය හුවමාරු වැඩසටහන ඔස්සේ කුඩා කළ සිට ම දරුවන් එබඳු චින්තනයකට යොමු කිරීම සඳහා වැදගත් ආරම්භයක් වේ යැයි මා සිතනවා.

## පුරෝගාමී මෙහෙවරක්

බ්ලූම්ෆීල්ඩ් දෙමළ මහා විද්‍යාලය
**විදුහල්පති දේවරාජ් මහතා**



සාමය සඳහා පුරෝගාමී වන දරුවන්ට සාමයේ අවශ්‍යතාව සහ එහි වැදගත්කම පෙන්වා දීම අතින් මේ වැඩසටහන වැදගත් වෙනවා. උසස් මානව සමාජයක් ගොඩ නැගීම සඳහා දරුවන්ගේ හදවත්වල සැබෑ සාමය පිළිබඳ අදහසක් ජනිත කරවීම අද යුගයේ ඓතිහාසික කටයුත්තක් වෙනවා.




# මල් වත්තක විවිධ මල්



ඌව පළාත් සභාවේ සභාපති
**මානෙල් රත්නායක**

අපි බොහෝ දෙනෙකුට වතුකරයේ දෙමළ ජනතාවගේ සංස්කෘතිය, ආගම සහ ජන ජීවිතය පිළිබඳ හැඟීමක් නැහැ. වතුකරයේ දෙමළ ජනතාව සහ සිංහල ජනතාව අතර දුරස් බවක් තියෙනවා. අවුරුදු 25-30 ක් තිස්සේ කෙරුණු යුද්ධයක් නිසා සිදු වී ඇති විනාශය අතිමහත්.

ලංකාව බහු වාර්ගික, බහු ආගමික රටක්. මෙය තේරුම් ගත නොහැකි වූ නිසා ප්‍රශ්න රැසක් පැන නැගී තිබෙනවා. ඒ ඒ ජන වර්ගවලට අනන්‍ය වූ භාෂාව, ආගම හා සංස්කෘතිය පිළිබඳ අවබෝධය හා පිළිගැනීම අඩුවීම මෙම තත්ත්වයට හේතුවක්. අපේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකම යුද්ධය අවසන් කොට සාමය ස්ථාපිත කිරීම සඳහා දේශපාලන විසඳුමක් ඉල්ලා සිටිනවා. යුද්ධමය විසඳුමකින් මෙය විසඳිය නොහැකි බවත් සිදුවන්නේ දිගින් දිගට ම මිනිසුන් මිය යෑම බවත් තහවුරු වී තිබෙනවා.

ඇතැම් භික්ෂූන් වහන්සේලා දේශපාලන විසඳුමකට විරුද්ධ වුණත් භික්ෂූන් වහන්සේලාගෙන් බහුතරයකගේ මතය එය නොවෙයි.

එල්ටීටීඊ සංවිධානය දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි. නමුත් පවතින වාතාවරණය අනුව ඔවුන්ට පදනමක් ඇති වුනා. ඔවුන් අන්තයකට තල්ලු වී ගියා. මේ ගැටුම විසඳිය හැක්කේ සියලු ජන වර්ගවල, අනන්‍යතාව සහ ඔවුන්ගේ ගෞරවය ආරක්ෂා වන සාධාරණ බලය බෙදීමකින්, මල් වත්තක එකම මල් තිබුණාම ලස්සන නැ. විවිධ මල් පිපෙන්න ඕනෑ. මිනිස් සමාජයත් එහෙම තමයි.

# සිසුන්ගේ අදහස්

## අදහස් සමානයි.



**ශ්‍යාමලී දොළුවෙගෙදර**

මේ පළාතේ සියලු ජන කොටස් සමගියෙන් සිටිනු දැකීම සතුටට කරුණක්. මේ කඳවුරට සහභාගී වූ මට දැනුණේ අපේ භාෂාමය වෙනස්කම් තිබුණට අදහස් උදහස් අතින් සමාන බවයි. මේ සුහදකම දිගටම පවතින බව මට විශ්වාසයි. මේ තත්ත්වය රටේ හැමතැනමත් පවතිනවා නම් කොච්චර හොඳ ද? අපි පෑනේ මිතුරන් හැටියට හෝ අපේ සුහදත්වය පවත්වා ගෙන යමු.

## මොට්ටුවක් තිබ්බෙ අද



**ශෂිනි බියගම**

අපි බදුල්ලට ආවේ සෙංකඩගලින්. ඒත් අපි දෙමළ අය ආශ්‍රය කරලා තියෙනවා අඩුයි. අපේ හුඟක් අයට දෙමළ බෑ. නමුත් දෙමළ සිසුන් හුඟක් අයට භාෂා තුනක් පුළුවන්. ඒක සතුටට කරුණක්. මම කවදාවත් මොට්ටුවක් තියල නැ. අද ඒකත් තියා ගත්තා. දෙමළ අය මෙච්චර එකතු වෙයි කියලා කවදාකවත් හිතුවෙ නෑ. මීදුමෙන් වැසුනු කඳුකරයේ ලස්සන මේ ජීවිත ඇතුළෙ නැ.

අපි දැක්කා ඔවුන් ජීවත් වෙන හැටි. මං කැමතියි දෙමළ කතා කරන්න. දෙමළෙන් ලියන්න. මං කැමතියි මේ අය දීර්ඝ කාලීනව ආශ්‍රය කරන්න. යුද්ධයට හේතුව අපට දෙමළ බැරිකම. දෙමළ අයට සිංහල පුළුවන්. ප්‍රශ්නය දුර දිග ගියේ ඒකයි.

## දුක්බර කථාවක්



**මිලින්ද උචිත**

අපගේ නිරීක්ෂණයේ දී අපට පෙනුනේ ඒ අයගේ ජීවිත දුක්බර කතාවලින් වැසී ඇති බවයි. ඔවුන්ට හරිහැටි අධ්‍යාපනයක් ලබන්න විදියක් නැ. ලැබෙන පඩිය මදි. ඔවුන්ගෙන් අප ලද අත්දැකීම් විශිෂ්ටයි.

## සහෝදරත්වය



**චාන්දනී රත්නායක**

ඔවුන් අපි සහෝදරත්වයෙන් පිළිගත්තා. හොඳ සංග්‍රහ ලැබුණා. අපට දෙමළ බැහැ. ඒත් ඔවුන්ට සිංහල දෙමළ දෙක ම පුළුවන්. ඔවුන් මේ බෙදීමට කැමති නැහැ. මම හිතුවේ

ඔවුන් සතුටින් ඇති කියලා. බාහිර පෙනුමෙන් එසේ වුවත් ඔවුන් විශාල දුකක් විඳින බව අපට පෙනුණා.

## සුන්දර අත්දැකීමක්

**අයෝධ්‍යා දිලිනි**



අපි මහනුවර සිට දුෂ්කර ගමකට ආවා. අපි දෙල්තොට හිටියට දෙමළ අය ආශ්‍රය කරල තිබ්බෙ නැහැ. මේ දවස් දෙක තුනට අපට දෙමළ වචන ටික ටික පුළුවන්. මේක හරි සුන්දර අත්දැකීමක්. දුක් කාරණා තිබිය දීත් මේ සොයුරන් ඉදිරියට යන එක අපටත් හොඳ අත්දැකීමක්.

## කොච්චර දක්ෂ ද?

**චමීරා**



අපව මනුෂ්‍යත්වයෙන් පිළිගත්තා. ඔබ මනුස්සකම අතින් කෙතරම් ධනවත් ද? ඒ වගේම ඔබ කොච්චර දක්ෂ ද යන වග අප අවබෝධ කරගත්තා. මතු පිටින් වෙනසක් ඇතත් ඇතුළතින් අප සමානයි. ඔබේ දැනුම, ආකල්ප අපට ප්‍රයෝජනවත්. මේ අත්දැකීම අනෙක් අයටත් ලැබෙනවා නම් හොඳයි.

## විශාලම අත්දැකීම

**චන්දිකා කුමාරි**



මා ලැබූ විශාල ම අත්දැකීමත් මෙය, දෙමළ සහ සිංහල වශයෙන් අප අතර ඇති පරතරය තේරුම් ගන්නත් එය නැතිකර ගැන්නත් මෙය හොඳ අවස්ථාවක් උනා. අපට, ඉඳුම් හිටුම්, සංග්‍රහ සුහද කතා බහ සියල්ල ලැබුණා.

## සින්දු කීවා

**දර්ශන කුමාර**



අප ජීවිතයේ මෙතරම් අපූරු අත්දැකීමක් ලැබුවේ පළමු වරටයි. වැඩමුළුව පැවති දවස් තුනේ රාත්‍රියට අපි නිදාගන්නේ නැතුව සින්දු කීවා. අපි කියපු සින්දුවලට කිසිම භේදයක් තිබ්බේ නෑ. කවුරුත් රස වින්දා. අනෙක් අයත් එක්ක සම්බන්ධ වෙන්න අදහස් බෙදා ගන්න අපට අපහසු වුයේ නෑ.

## අවිශ්වාසය නැති වුණා.

**ශෂිකා දිල්ශානි**



අපි මෙහාට එනකොට බයෙන් ආවේ. දෙමළ ළමයි එක්ක එකට ඉන්නෙ කොහොමද? කියලා. අපි දෙමළ දන්නෙ නෑ. අපි අත්දැකීම් හුවමාරු කර ගන්නෙ කොහොමද කියන ගැටලුව තිබුණා. ඒත් සිංහල අපට වඩා මේ අයට සිංහල පුලුවන්. ඉතින් අපේ බය, අවිශ්වාසය නැති වුණා. අපි දෙගොල්ලොම එක අම්මගෙ දරුවො නේද කියලා හිතුණා.

## පළමු පියවර



මඩුල්ල කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ
**සී. ගුණරත්න**

පාසල් හයක් නියෝජනය කරමින් සිංහල දෙමළ මුස්ලිම් සිසු සිසුවියන් විශාල පිරිසක් පැමිණ සිටීම සතුටට කරුණක්. මඩුල්ලේ පාසල් 22 ම සිංහල. ඒ නිසා මෙය විශේෂ අත්දැකීමක්. ජාතික ඒකාබද්ධතාව හා සාමයට අදාළ අමාත්‍යංශයක් තියෙනවා. පුහුණු නිලධාරීන් ඉන්නවා. අමාත්‍යංශ චක්‍රලේඛවලට අනුව වැඩ සටහන් ක්‍රියාත්මක වෙනවා. පාසල් මිත්‍ර සංගම් මේ අතින් විශේෂයි. ඒත් අපේ පළාතේ සිංහල දරුවන් පමණක් සිටින නිසා මෙයින් බලාපොරොත්තු වූ ඉලක්ක ඉටු වුණේ නෑ.

## පාසල් වියේ සිටම



**මොණරාගල මඩුල්ල මහා විදුහල විදුහල්පති**

පාසල් ඉතිහාසයේ ජාතීන් අතර එකමුතුකම වර්ධනය කරන වැඩ සටහනක් කෙරුණේ පළමුවරට. හුවමාරු කරන භාෂාව වෙනස් වුනත් අපේ හදවත් එකයි.

මගේ පාසල් වියේ දී මට පද්මනාදන් සහ මොහොමඩ් යන දෙමළ මිතුරන් සිටියා. අපි ඉගෙන ගත්තේ සිංහල මාධ්‍යයෙන්, අදත් සම්බන්ධතා තියෙනවා. මම යාපනය විශ්ව විද්‍යාලයේ ඉගෙන ගනිද්දී දෙමළ මිතුරන් විශාල පිරිසක් සම්බන්ධ වුනා. අප අතර එදත් අදත් ඇත්තේ එකම විදියේ බැඳීමක් නමුත් අප සමාජය, වාර්ගිකත්වය මත භේද බින්න වෙලා. අපි ශ්‍රී ලාංකිකයන් බව අමතක වෙලා. මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා මේ වැඩ සටහන පිටු බලයක් වේවායි පතනවා.



අත්වැල් බැඳගත් මනුෂ්‍යත්වය

## පැවැත්වූ ස්ථානය- බදුල්ල සාරනියා දෙමළ විද්‍යාලය

දිනය - 2006 - ඔක්තෝබර් 27 සිට 29 දක්වා

| පාසලේ නම | ගැහැණු ළමයි | පිරිමි ළමයි | ගුරුවරුන් | ගුරුවරියන් | එකතුව |
|---|---|---|---|---|---|
| සාර්නියා දෙමළ විද්‍යාලය | 25 | 26 | 6 | 16 | 73 |
| හාලිඇල දෙමළ විද්‍යාලය | 13 | 17 | 1 | 2 | 33 |
| ස්ප්‍රින්වැලි දෙමළ විද්‍යාලය | 13 | 11 | 3 | 1 | 28 |
| මහ/කරගස්කඩ නවෝදා පාසල | 50 | 50 | 7 | 3 | 110 |
| | | | | | 224 |
| විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් | | | | | 10 |
| අනෙකුත් සිසුන් හා සහභාගිකයින් | | | | | 10 |
| එකතුව | | | | | 264 |

## පැවැත්වූ ස්ථානය- මහනුවර කරගස්කඩ නවෝද්‍යා පාසල

දිනය - 2007 - පෙබරවාරි 02 සිට 04 දක්වා

| පාසලේ නම | ගැහැණු ළමයි | පිරිමි ළමයි | ගුරුවරුන් | ගරුවරියන් | එකතුව |
|---|---|---|---|---|---|
| මහ/කරගස්කඩ නවෝදා පාසල | 53 | 39 | 11 | 8 | 111 |
| හාලිඇල දෙමළ විද්‍යාලය | 13 | 17 | 1 | 2 | 33 |
| ස්ප්‍රින්වැලි දෙමළ විද්‍යාලය | 15 | 15 | 4 | 3 | 37 |
| සාර්නියා දෙමළ විද්‍යාලය | 22 | 14 | 5 | 4 | 45 |
| | | | | | 226 |
| විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය | | | | | 10 |
| අනෙකුත් සිසුන් හා සහභාගිකයින් | | | | | 40 |
| එකතුව | | | | | 276 |

## පැවැත්වූ ස්ථානය- අ/වලිසිංහ හරිශ්චන්ද්‍ර විද්‍යාලය

දිනය - 2006 - නොවැම්බර් 03 සිට 05 දක්වා

| පාසලේ නම | ගැහැණු ළමයි | පිරිමි ළමයි | ගුරුවරුන් | ගරුවරියන් | එකතුව |
|---|---|---|---|---|---|
| අ/වලිසිංහ හරිශ්චන්ද්‍ර විද්‍යාලය | 39 | 24 | 5 | 3 | 71 |
| බ/ලුනුගල දෙමළ විද්‍යාලය | 28 | 19 | 4 | 2 | 53 |
| බ/පස්සර දෙමළ විද්‍යාලය | 31 | 35 | 6 | 1 | 73 |
| | | | | | 197 |
| විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය | | | | | 18 |
| අනෙකුත් සිසුන් හා සහභාගිකයින් | | | | | 30 |
| එකතුව | | | | | 245 |

## පැවැත්වූ ස්ථානය - බ/පස්සර දෙමළ විද්‍යාලය

දිනය - 2006 - සැප්තැම්බර් 22 සිට 24 දක්වා

| පාසලේ නම | ගැහැණු ළමයි | පිරිමි ළමයි | ගුරුවරුන් | ගරුවරියන් | එකතුව |
|---|---|---|---|---|---|
| අ/වලිසිංහ හරිශ්චන්ද්‍ර විද්‍යාලය | 50 | 53 | 5 | 5 | 113 |
| බ/ලුනුගල දෙමළ විද්‍යාලය | 28 | 19 | 4 | 2 | 53 |
| බ/පස්සර දෙමළ විද්‍යාලය | 31 | 35 | 10 | 5 | 73 |
| | | | | | 239 |
| විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් | | | | | 10 |
| අනෙකුත් සිසුන් හා සහභාගිකයින් | | | | | 5 |
| එකතුව | | | | | 254 |

## පැවැත්වූ ස්ථානය - අ/සහිරා විද්‍යාලය

දිනය - 2007 - පෙබරවාරි 09 සිට 11 දක්වා

| පාසලේ නම | ගැහැනු ළමයි | පිරිමි ළමයි | ගුරුවරුන් | ගුරුවරියන් | එකතුව |
|---|---|---|---|---|---|
| අ/සහිරා මුස්ලිම් විද්‍යාලය | 30 | 61 | 3 | 2 | 97 |
| අ/විවේකානන්ද දෙමළ විද්‍යාලය | 5 | 20 | 1 | 1 | 27 |
| කු/හින්දු දෙමළ විද්‍යාලය | 10 | 21 | 2 | 2 | 35 |
| මා/මැදබැද්ද විද්‍යාලය | 0 | 10 | 1 | 11 | 22 |
| | | | | | 170 |
| විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් | | | | | 10 |
| අනෙකුත් සිසුන් හා සහභාගිකයින් | | | | | 45 |
| එකතුව | | | | | 254 |



අ/හරිශ්චන්ද්‍ර ම.වි. පැවති කඳවුරේ දී ක්‍රීඩාවේ යෙදෙන සිසු සිසුවියන් පිරිසක්



බිලුම්ෆීල්ඩ් වතුයායේ ක්ෂේත්‍ර චාරිකාවේ යෙදෙන ඇතුගල්පුරයේ සිසුන් පිරිසක්

# පැවැත්වූ ස්ථානය- මොණරාගල මඩුල්ල මහා විද්‍යාලය

දිනය - 2007 - ජනවාරි 19 සිට 21 දක්වා

| පාසලේ නම | ගැහැනු ළමයි | පිරිමි ළමයි | ගුරුවරුන් | ගුරුවරියන් | එකතුව |
|---|---|---|---|---|---|
| මො/මඩුල්ල මහා විද්‍යාලය | 30 | 31 | 2 | 4 | 67 |
| අ/සහිරා මහා විද්‍යාලය | 18 | 28 | 2 | 2 | 50 |
| අ/විවේකානන්ද දෙමළ විද්‍යාලය | 5 | 13 | 0 | 2 | 20 |
| මො/විපුලානන්ද දෙමළ විද්‍යාලය | 12 | 13 | 0 | 1 | 26 |
| මො/බකිනිලහවෙල විද්‍යාලය | 8 | 8 | 0 | 2 | 18 |
| බ/ලුනුගල දෙමළ විද්‍යාලය | 15 | 10 | 2 | 2 | 30 |
| | | | | | 211 |
| විකල්ප ප්‍රතිපත්ති කෙන්ද්‍රයෙන් | | | | | 10 |
| අනෙකුත් සිසුන් හා සහභාගිකයින් | | | | | 5 |
| එකතුව | | | | | 226 |

# පැවැත්වූ ස්ථානය- නුවරඑළිය හැටන් හයිලන්ඩ් විද්‍යාලය

දිනය- 2006 - සැප්තැම්බර් 29 සිට ඔක්තෝබර් 01 දා

| පාසලේ නම | ගැහැනු ළමයි | පිරිමි ළමයි | ගුරුවරුන් | ගුරුවරියන් | එකතුව |
|---|---|---|---|---|---|
| නු/හයිලන්ඩ් විද්‍යාලය | 29 | 9 | 2 | 0 | 40 |
| නු/පුලියාවත්ත දෙමළ විද්‍යාලය | 0 | 9 | 1 | 0 | 10 |
| නු/නෝර්වුඩ් දෙමළ විද්‍යාලය | 8 | 26 | 2 | 2 | 38 |
| අම්/ගලහිටායාගොඩ මහා විද්‍යාලය | 28 | 8 | 3 | 2 | 41 |
| අම්/උහන මහා විද්‍යාලය | 23 | 10 | 3 | 2 | 35 |
| අම්/රජගලතැන්න මහා විද්‍යාලය | 18 | 13 | 2 | 2 | 35 |
| | | | | | 202 |
| විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් | | | | | 10 |
| අනෙකුත් සිසුන් හා සහභාගිකයින් | | | | | 15 |
| එකතුව | | | | | 227 |

## පැවැත්වූ ස්ථානය - නුවරඑළිය මස්කෙළිය බිලුම්ෆීල්ඩ් දෙමළ විද්‍යාලය

දිනය - 2006- ඔක්තෝබර් 06 සිට 08 දක්වා

| පාසලේ නම | ගැහැණු ළමයි | පිරිමි ළමයි | ගුරුවරුන් | ගරුවරියන් | එකතුව |
|---|---|---|---|---|---|
| නු/ බිලුම්ෆීල්ඩ් දෙමළ විද්‍යාලය | 21 | 19 | 3 | 3 | 46 |
| නු/ශාන්ත ජෝෂප් දෙමළ විද්‍යාලය | 21 | 11 | 1 | 1 | 34 |
| කු/ ගොකරැල්ල මහා විද්‍යාලය | 15 | 28 | 4 | 2 | 49 |
| කු/ මැදමුල්ල ද මැල් මහා විද්‍යාලය | 26 | 17 | 3 | 2 | 48 |
| කු/හින්දු දෙමළ විද්‍යාලය | 13 | 9 | 2 | 1 | 25 |
| | | | | | 202 |
| විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් | | | | | 10 |
| අනෙකුත් සිසුන් හා සහභාගිකයින් | | | | | 20 |
| **එකතුව** | | | | | **232** |

## පැවැත්වූ ස්ථානය - කු/ හින්දු දෙමළ විද්‍යාලය

දිනය - 2007- පෙබරවාරි 23 සිට 25 දක්වා

| පාසලේ නම | ගැහැණු ළමයි | පිරිමි ළමයි | ගුරුවරුන් | ගුරුවරියන් | එකතුව |
|---|---|---|---|---|---|
| නු/ බිලුම්ෆීල්ඩ් දෙමළ විද්‍යාලය | 24 | 19 | 7 | 4 | 54 |
| බ/ පස්සර දෙමළ විද්‍යාලය | 20 | 26 | 4 | 2 | 52 |
| කු/ ගොකරැල්ල මහා විද්‍යාලය | 12 | 23 | 2 | 2 | 38 |
| කු/ මැදමුල්ල ද මැල් මහා විද්‍යාලය | 12 | 18 | 2 | 3 | 35 |
| කු/හින්දු දෙමළ විද්‍යාලය | 9 | 10 | 1 | 1 | 21 |
| | | | | | 200 |
| විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් | | | | | 10 |
| අනෙකුත් සිසුන් හා සහභාගිකයින් | | | | | 20 |
| **එකතුව** | | | | | **230** |



ආරාධිත පාසල් චාරිත්‍රානුකූලව පිළිගැනීමට බලා සිටින සාර්නියා විදුහලේ සිසුවියන් හා ගුරුවරියන්

# බදුල්ල සාර්නියා දමිළ මහා විද්‍යාලයේ සිසු කඳවුර

දිනය 2006 ඔක්තෝබර් 27 සිහින් සිරිපොද වෑස්සෙමින් පැවතිණ. මහනුවර හරස්කඩ මහා විද්‍යාලයේ සිසු කණ්ඩායම සාර්නියා මහා විද්‍යාලයට පැමිණෙන විට ප.ව. 4.00 පමණ විය. විදුහලේ තූර්ය වාදක කණ්ඩායම විසින් ආගන්තුකයන් පාසල වෙත කැඳවාගෙන එනු ලැබී ය.

බදුල්ල දරු දැරියෝ මහනුවර දරු දැරියන්ගේ නළල් තලවල රතු තිලක තබා ඔවුන් පිළිගත්හ. ඌව පළාත් සභාවේ සභාපති මානෙල් රත්නායක විසින් ජාතික ධජය ඔසවන ලද අතර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ලයනල් ගුරුගේ මහතා විසින් අන්තර් වාර්ගික ශිෂ්‍ය හුවමාරු වැඩසටහනේ ධජය ඔසවන ලදි. සිංහල හා දෙමළ භාෂා දෙකින්ම ජාතික ගීය ගායනා කරනු ලැබිණ. චිරාගත සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දැල්වීම සිදු කරන ලද්දේ ඌව පළාත් සභාවේ සභාපති මානෙල් රත්නායක, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වැඩසටහන් කළමනාකරු ලයනල් ගුරුගේ, කරගස්කඩ මහා විදුහලේ විදුහල්පති, සාර්නියා දෙමළ මහ විදුහලේ විදුහල්පතිනි ස්ප්‍රින්වැලි විදුහල්පති, හාලිඇල දමිළ මහ විදුහල්පති, වැඩසටහන් සම්බන්ධීකාරක කෞමදී රණවීර සහ පාසල් ශිෂ්‍යයෙක් ද, ශිෂ්‍යාවක් ද විසිනි.

සාර්නියා දෙමළ මහා විදුහල් ශිෂ්‍යයකු විසින් පිළිගැනීමේ කතාව පවත්වන ලදි. ඊළඟට ඉඩකඩ සැලසුණේ ත්‍රිවිධ ආගමික නායකයින්ගේ අනුශාසනාවලට ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වැඩසටහන් කළමනාකරු ලයනල් ගුරුගේ විසින් මේ වැඩසටහනේ අරමුණු පැහැදිලි කරන ලදි.

මේ වැඩසටහන මිනිස්කම සොයා යෑමේ ගවේෂණයක් බව සඳහන් කළ ඔහු ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වෙනත් ජනවර්ගවලට අයත් මිතුරු මිතුරියන් නොමැතිවීමේ අඩුපාඩුව ජනහිඳියාවට බාධකයක් වී ඇති බව පෙන්වා දුන්නේ ය.

උළෙලේ ප්‍රධාන ආරාධිතයා වූ ඌව පළාත් සභාවේ සභාපති මානෙල් රත්නායකගේ දෙසුම ඊළඟට පැවැත්විණ.

''අපේ රට බහුවාර්ගික රටක් බව අමතක කිරීම යුද්ධයක් ඇතිවීමට හේතු වී තිබෙනවා. අප අතර ඇති විවිධත්වය අවබෝධ කර ගැනීමේ ක්‍රමයක් අවශ්‍යයි. අප මිනිසුන් වශයෙන් සමාන වුණත් භාෂාමය සහ සංස්කෘතිකමය වශයෙන් විවිධත්වයක් තිබෙනවා. මේ විවිධත්වය තේරුම් ගෙන ඊට ගරු කරමින් ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ලබාදීම සඳහා පෙරට යා යුතුයි. ඒ සඳහා දේශපාලන පක්ෂ අතර ඇති වී තිබෙන සම්මුතිය අප විසින් ශක්තිමත් කළ යුතුයි''

සාර්නියා විදුහලේ විදුහල්පතිනි සහ කරගස්කඩ විදුහල්පතිවරයා ද වැඩසටහන සම්බන්ධයෙන් අදහස් දැක්වූහ.

අදහස් දැක්වීම්වලින් අනතුරුව සිසු කඳවුර පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය රීති පද්ධතියක් සකස් කරගන්නා ලදි.

සාම්ප්‍රදායික දෙමළ නාට්‍ය සම්ප්‍රදායට අයත් කුත්තු නාට්‍ය ශෛලිය පිළිබඳ සකස් කෙරුණු වාර්තාමය චිත්‍රපටියක් නැරඹීමේ අවස්ථාව ඉන් පසුව ලැබිණ. රාත්‍රී ආහාරයට පෙර උදාවූයේ සිසු සිසුවියන් තම ගී ගායනා ඉදිරිපත් කිරීමේ අවස්ථාවයි.

කඳවුරේ දෙවැනි දිනය සුපුරුදු ලෙස ශරීර සුවතා වැඩසටහනෙන් ආරම්භ විය. ඉන් අනතුරුව කණ්ඩායම් වශයෙන් ක්ෂේත්‍ර චාරිකාවෙහි යෙදිණ.

ක්ෂේත්‍ර චාරිකාව අවසන දිවා ආහාරය ගැනීමෙන් අනතුරුව ජනශ්‍රැති පර්යේෂක ගුණසේකර ගුණසෝම ගේ මූලිකත්වයෙන්, ජනශ්‍රැතියෙන් පිළිබිඹු වන ජන විවිධත්වය සහ සංස්කෘතික සහජීවනය පිළිබඳ කතිකාවතක් පැවතිණ.

ජනශ්‍රැති අධ්‍යයන වැඩසටහනෙන් පසුව විවිධ ක්‍රීඩා ඉසව් පැවැත්විණ.

ප.ව. 7.30ට පමණ සංස්කෘතික සන්දර්ශනය ආරම්භ විය. කඳවුරෙහි අවසාන දින සිසු සිසුවියන් දැක්වූ අදහස් මෙසේ ය.



බ/සාරනියා විදුහලේ කඳවුරට පැමිණෙන මග/කරගස්කඩ විදුහලේ සිසුන්



බ/සාරනියා විදුහලේ කඳවුරට පැමිණෙන මහ/කරගස්කඩ විදුහලේ සිසුවියන්



සෙංකඩගල පුරවරයෙන් බදුල්ලට පැමිණි ගුරුවරියන් සතුට බෙදාගනිමින්

## යන්න හිතයි

**ප්‍රභාකරන්**



හරස්කඩ විද්‍යාලයෙන් අපේ පාසලට පැමිණි සහෝදර සහෝදරියන්ට ස්තුති කරනවා. ඔබලාගේ පාසලට එන්න ජනවාරි මාසය වන තුරු බලාගෙන ඉන්න වෙන හින්දා ඔබලාගේ බස් එකේ නැගලා යන්න හිතෙනවා.

## හැමෝම සමානයි

**විජය ප්‍රභා**



අපේ භාෂාව විවිධයි, සංස්කෘතිය විවිධයි. නමුත් අපි මිනිසුන් විදියට සමානයි. හරියට එකම පුස් අම්මෙකුගේ පාට පාට පැටව් වගේ. අපි සියලු දෙනා ම එකට එකතු වුණොත් සමය ඇතිකළ හැකියි.



# ආචාර්ය මණ්ඩලයේ අදහස්

## භාෂා දෙකින්ම අධ්‍යාපනය

**සාර්නියා විදුහලේ හිටපු විදුහල්පති**



මගේ ගුරු ජීවිතයේ දී මෙවැනි වැඩසටහන් රාශියකට සහභාගී වී තිබෙනවා. මේ රටට යහපත් අනාගතයක් උදාකරදීම සඳහා මෙය වැදගත් වේ යයි මා විශ්වාස කරනවා. පාසල් 4ක් අතර සම්බන්ධයක් මේ වැඩසටහන නිසා ඇති වුණා. සිංහල, දෙමළ භාෂා දෙකින් ම කටයුතු කරන පාසල් අපේ රටේ තිබුණා නම් මීට වඩා යහපතක් රටට වෙන්න තිබුණා.

## කාලීනයි

**කරස්කඩ මධ්‍ය මහා විදුහල්පති**



අපි බොහොම වාසනාවන්තයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මේ ගෙනියන වැඩසටහන ඉතාම කාලීනයි. දරු දැරියන්ගේ හදවත්වල සාමයේ පණිවුඩය සුන්දර විදියට තැන්පත් වී ඇති බව පෙනුණා.

## මවක් සේ රැකවරණ දුන්නා

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ

**කෞමදී රණවීර**



විදුහලේ විදුහල්පතිනිය අම්මා කෙනෙක් දරුවෝ ටික බලාගන්නවා වගේ මේ ළමයි ටික බලා ගත්තා. දෙල්තොටින් පැමිණි ගුරුතුමාත් වසන්ත කුමාර ගුරුතුමාත් විශේෂ කැපවීම් කළා. මේ වැඩසටහන මේ තරම් සාර්ථක වුණේ ඔබ ඔබේම වැඩසටහනක් බවට පත්කරගත් නිසයි.



පිළිසඳරේ යෙදෙන අම්/ගලහිටියාගොඩ හා පස්සර දෙ.ම.වි. සිසුවියන්




නර්තනයෙන් සහෘදයන් පිළිගත් අම්/ගලහිටියාගොඩ ම.වි. සිසුවියන්



අ/හරිස්චන්ද්‍ර ම.වි. පැවති කඳවුරේ ක්ෂේත්‍ර චාරිකාවට සහභාගි වූ සිසු සිසුවියන් පිරිසක් කුකුළෑව ප්‍රදේශයේ නිවසක



අ/හරිස්චන්ද්‍ර විද්‍යාලයේදී සිහිවටන පැල සිටුවීම සඳහා පස්සර දෙ.ම.වි. සිසුවකු විසින් සත්කාරක පාසලට පැලයක් පිළිගන්වමින්



හැටන් හයිලන්ඩ් විද්‍යාලයේ පැවති කඳවුරේදී ක්‍රීඩාවේ යෙදීමට සූදානම් වූ සිසු සිසුවියන් පිරිසක්




පස්සර දෙමළ ම.වි. පැවති කඳවුරේ ආරාධිත පාසල් පිළිගැනීමට මඟ බලා සිටින පස්සර සහ ලුණුගල දෙ.ම.වි. සිසු සිසුවියන් හා ගුරුවරුන්




මහ/කරගස්කඩ ම.වි. පැවති කඳවුරේ දී පනස් නම වෙනි නිදහස් සමරු දින සමරමින් එම පාසලේ සිසු සිසුවියන් පිරිසක් ජාතික ගීය ගායනා කරන අයුරු




මස්කෙලිය බ්ලූම්ෆීල්ඩ් විද්‍යාලයේ සිසුවියක් විසින් ආරාධිත කු/හින්දු දෙමළ ම.වි. සිසුවකු චාරිත්‍රානුකූලව පිළිගනිමින්



කු/හින්දු දෙමළ ම.වි. පැවති කඳවුරේ ක්‍රීඩා පිටියට වී ආහාර ගන්නා පස්සර දෙමළ ම.වි. සිසුවියන් පිරිසක්



පස්සර දෙ.ම.වි. සිසුන් හා ඇතුගල්පුරයේ සිසුන් කු/ හින්දු දෙ. විද්‍යාලයේ පැවති කඳවුරේ ක්ෂේත්‍ර චාරිකාවේ යෙදෙමින්



මඩුල්ල ම.ම.වි. පැවති කඳවුරේදී ආරාධිත පාසලක සිසුවියන් පිරිසක් ක්‍රීඩාවේ යෙදෙන අයුරු




මස්කෙලිය බ්ලූම්ෆීල්ඩ් විද්‍යාලයේ කඳවුරට පැමිණෙන ඇතුගල්පුරයේ පාසල් ගුරුවරියක් හා සිසු සිසුවියන් පිරිස



අ/සහිරා ම.වි. පැවති කඳවුරේ සිහිවටන පැල සිටුවීමේ යෙදී සිටින කු/හින්දු ම.වි, මාතලේ මැදබැද්ද ම.වි, අ/ විවේකානන්ද හා අ/ සහිරා සිසු සිසුවියන් පිරිසක්



මස්කෙලිය බ්ලූම්ෆීල්ඩ් විද්‍යාලයේ පැවති කඳවුරේ ක්ෂේත්‍ර චාරිකාව පිටත්වීමට පෙර උපදෙස් ලබමින්



බ/ සාරනියා ම.වි. පැවති කඳවුරේ සිය පාසලට චාරිත්‍රානුකූලව ආරාධිත පාසල් කැඳවාගෙන යන පාසල් තූර්යවාදක කණ්ඩායම



බ/ සාරනියා විද්‍යාලයේ පැවති කඳවුර අවසානයේ එම විද්‍යාලයේ සිසුවියකට සමුදෙන කරගස්කඩ ම. වි. ශිෂ්‍යාවක්




සිය ආරාධිත පාසල් පිළිගැනීම සඳහා මඟ බලා සිටින හයිලන්ඩ් විද්‍යාලයේ තූර්ය වාදක කණ්ඩායම

# හැටන් හයිලන්ඩ් විදුහල් කඳවුර

මෙම කඳවුරෙහි සත්කාරක පාසල් වශයෙන් හයිලන්ඩ් විදුහල නෝර්වුඩ් විදුහල සහ පුලියාවත්ත විදුහල කටයුතු කළේ ය. ආරාධිත පාසල් වූයේ අම්පාර උහන මහ විදුහල රජගලතැන්න මහ විදුහල සහ ගලහිටියාගොඩ මහ විදුහලයි.

හැටන් හයිලන්ඩ් විදුහල වෙත පැමිණි ආරාධිත සිසු සිසුවියන් පිළිගන්නා ලද්දේ සත්කාරක සිසුන් විසින් නළලේ මොට්ටු තැබීමේ චාරිත්‍රයෙනි. මෙය ආරාධිත සිසුන් හට අමතක නොවන අත්දැකීමක් විය.

ජාතික කොඩිය සහ පාසල් කොඩිය එසවීම සිදු කෙරුණේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමාජ වැඩසටහන් සම්බන්ධීකාරක ලයනල් ගුරුගේ, හැටන් හයිලන්ඩ් විදුහල්පති වරයා හා අම්පාර ජාතීන් අතර මිත්‍රත්ව පදනමේ සභාපති බුද්ධි ගුණසේකර යන මහත්වරුන් අතිනි. පොල් තෙල් පහන දල්වා ආගම සිහි කිරීමෙන් අනතුරුව පිළිගැනීම හා අරමුණු පැහැදිලි කිරීම කරන ලද්දේ ලයනල් ගුරුගේ මහතා විසිනි.

දිවයිනේ විවිධ පළාත්වල දිවි ගෙවන කිසිදා හමු නොවූ සිසු සිසුවියන් පිරිසක් එකට එක් වූ මේ අවස්ථාව සුවිශේෂී අත්දැකීමක් බව ඔහු ප්‍රකාශ කළේ ය. ඔහු වැඩි දුරටත් මෙසේ ද කී ය. "එකිනෙකා කෙරෙහි සැකයෙන් හා අවිශ්වාසයෙන් බලන, ජාතික ගැටලුවක් පවතින මෙවැනි රටක මෙවැනි හමුවීම් හැම දෙනාට ම

ආශිර්වාදයක්. පාසල් දරුවන් යනු රටේ අනාගත බලාපොරොත්තුවයි. අනාගතය බාර ගන්නා පුද්ගලයන් හැටියට තමන් තුළ ගුණ ධර්ම රාශියක් වගා කරගත යුතු ය. අනන්‍යතාවන්ට ගරු කිරීම හා විවිධත්වය ඉවසීම ඒ අතර ප්‍රධානයි. සිංහල, දෙමළ හා මුස්ලිම් ලෙස නොබෙදා, පොදු ආකල්ප ඇති සුබවාදී දැක්මක් මේ කඳවුර ඔස්සේ බිහිවීම වැදගත්"

සත්කාරක පාසල් වෙනුවෙන් පිළිගැනීමේ කතාව කරන ලද්දේ නෝර්වුඩ් දෙමළ විදුහලේ ආර්. සත්‍යශිලන් මහතා විසිනි. සත්කාර පාසල් වෙනුවෙන් හයිලන්ඩ් විදුහලේ මුත්තුකුමාර් මහතා කථා කළේ ය. ස්තූති කතාව කරන ලද්දේ කඳුරට ක්‍රියාකාරී සංවිධානයේ සභාපති එස්. සන්දනම් මහතා විසිනි. ශිෂ්‍ය කඳවුරේ ස්වභාවය පිළිබඳ අදහස් පැහැදිලි කිරීම කරන ලද්දේ රවි චන්ද්‍රලාල් සහ ජගත් ලියනාරච්චි විසිනි. පිරිසිදුකම, පොදු දේපල රැක ගැනීම සහ නියමිත වේලාවට වැඩ කිරීම යන කරුණු එහිදී අවධාරණයට ලක් කෙරිණි.

ඉන්පසු දෙමළ සිසුන් හා සිංහල සිසුන් නියෝජනය වන පරිදි කණ්ඩායම් ගත කෙරිණි.

කඳවුරේ දෙවැනි දිනය ආරම්භ වූයේ සුපුරුදු ලෙස ශාරීරික අභ්‍යාස වලිනි. උදෑසන ආහාරයෙන් පසුව ක්ෂේත්‍ර චාරිකාව සිදු කෙරිණ. වතු ආශ්‍රිත ජන ජීවිතය නිරීක්ෂණය මෙහි අරමුණ විය. පානම් පත්තුවේ ජනශ්‍රැති ඇසුරෙන් අන්තර් සංස්කෘතික සම්බන්ධතා පිළිබඳ විවරණයක් කරන ලද්දේ ජනශ්‍රැති පර්යේෂක ගුණසේකර ගුණසෝම විසිනි.

ඔහුගේ දෙසුමෙහි ඇතුළත් වූ කරුණු මෙසේ ය. පානම් පත්තුව යනු අන්තර් සංස්කෘතික සබඳතා විෂයයෙහි ආදර්ශවත් ප්‍රදේශයකි. යම් යම් බිඳී යෑම් ඇතත් ප්‍රධාන ජාතීන් කිහිපයක් මානව සංකලනය වී එහි ජීවත් වෙයි. විවිධ ජන කොටස් අතර සිදුවන විවාහ පානම් පත්තුවේ කැපී පෙනේ.

සිංහල හා දෙමළ භාෂා දෙකම කතා කිරීමේ හැකියාව එහි සිටින සිංහල, දෙමළ, මුස්ලිම් ජනාතාව සතුව පවතී. එහි මානව සබඳතා ආදර්ශවත් ය. සංස්කෘතික හර ආරක්ෂා කිරීමෙහි ලා එහි මහඟු කැපවීමක් පවතී. 1983 කළු ජූලියෙන් පසුව ඇති වූ යුද්ධය හේතුවෙන්, මෙම සාමකාමී ජන දිවිය ඉරී තලා යන්නට විය.

දෙසුමෙන් පසුව විවිධ ක්‍රීඩා තරග පැවැත්විණි. සවස් කල පැවති ආකර්ෂණීය අංගය වූයේ සංස්කෘතික සංදර්ශනයයි. තෙවැනි දිනය ආරම්භ වූයේ පාසල් බිමෙහි පැවති ශ්‍රමදානයෙනි. සමාප්ති සැසිය වශයෙන් සිසු සිසුවියන්ට හා ගුරුවරුන්ට තම අදහස් පළ කිරීමේ අවස්ථාව ලැබිණ. අදහස් දැක්වීමෙන් අනතුරුව දිවා ආහාර ගැනීමෙන්. තෙදිනක කඳවුරු වැඩසටහන නිමාව දැක්කේ ය.


හයිලන්ඩ් විදුහලේ පැවති කඳවුරේ ක්ෂේත්‍ර චාරිකාවේ යෙදෙන සිසු සිසුවියන්

# ප්‍රතිපත්ති සම්පාදකයන්ට පාඩමක්

මඩුල්ල ප්‍රාදේශිය සභාපති
**සමන් ප්‍රේමසිරි වික්‍රමසිංහ**



මේ පළාතේ 99% ක් සිංහල, දෙමළ, මුස්ලිම් ජීවත් වන්නේ ඉතාමත් අඩුවෙන්. නමුත් රටේ පවතින යුධමය වාතාවරණයට ගොදුරු වී සංක්‍රමනය වූ දරුවන්ටත් මේ දරුවන්ටත්, තමන් එක මවකගේ දරුවන් යැයි සිතන්නට මෙය හොඳ පිටුවහලක්. පවතින අර්බුද හමුවේ රටේ ප්‍රතිපත්ති සම්පාදකයන් කෙසේ කටයුතු කළ යුතු ද යන්න පිළිබඳ අත්දැකීමකුත් මෙයින් ලැබෙනවා. දරුවන්ගේ සිත්වල එකමතු බව ඇති කළ විට අනාගත ශ්‍රී ලංකාව යහපත් එකක් බවට පත්වෙයි. මේ කටයුතුවල දී බාධක ඇති වෙයි. නමුත් ඒවා නොතකා ඉදිරියට යෑමයි වැදගත් වන්නේ.

# මඩුල්ල සිසුන්ගේ අදහස්

## සහෝදර ලංකාවක්

**ඉලේන්දියන්**



මගේ ජීවිතයේ මෙවැනි අත්දැකීමක් ලද පළමු අවස්ථාවයි. අපට සහෝදරත්වය පෑ සියලු දෙනාට ස්තූති වන්ත වෙනවා. අපි ජීවිතයට අලුත් දේවල් එකතු කර ගත්තා. අපට වඩාත් වැදගත් වන්නේ එකමුතුකමයි. සහජීවනයයි. අපි සහෝදර ලංකාවක් බිහි කරමු.

## සංස්කෘතික අවබෝධය

**එම්. කන්නදාසන්**



මීට මාස දෙකකට පෙර සංචාරයක් යන්න මගේ ඉංග්‍රීසි ගුරුවරයෙක් කතා කළා. ඒ සංචාරය ඉතා වටිනා එකක් වුනා. අපේ වැඩමුළුව දා නාමල් ඔය මිනිස්සු එක්ක කතා කළා. ඒ ගමේ සංස්කෘතිය ගැන අදහසක් අපට ඇති වුනා. ඒ අවස්ථාව ලබා දුන් අයට ස්තූතියි.

## කරුණාව

**සහරාබාහු**



අපි ගිය ගම්මානයේ මිනිසුන් සමගත් භික්ෂූන් සමගත් අදහස් හුවමාරු කරගත්තා. බුද්ධාගමේ සඳහන් වන කරුණාව, අවිහිංසාව ඔවුන්ගේ ජීවිත වලත් ඇති බව අපට දැනුණා.

## දිගටම පවතිනවා

**එම්.එච්. අක්‍රම්**



දවස් තුනක කාලයක දී සමීප වූ අපට වෙන් වී යෑම කණගාටුදායකයි. ඒත් අප තුළ ඇති වූ සුහදත්වය දිගට ම පවතීවි.

## ප්‍රශ්න විසඳිය හැකි යි.

**එච්. ඩබ්. ආනන්ද**



අපට එකමුතුවන්න අවස්ථාව ලැබුණා. මේ විදියට ම, හැම ජන කොටසකට ම එකමුතුවන්න පුළුවන් නම් අපේ රටේ හුඟක් ප්‍රශ්න විසඳේවි.

# අම්පාර ගලහිටියාගොඩ විදුහල් කඳවුර



අම්/ගලහිටියාගොඩ පාසලේ පැවති කඳවුරේ රාත්‍රී කෑම වේල සහෝදරත්වයෙන් යුතුව බෙදාගන්නා සිසුවියන් දෙදෙනෙක්

## මෙහෙ යුද්ධයක් නෑ.

**පස්සර විදුහලේ ඉලේන්ද්‍රයන් මහතා**



අපි අපේ පාසලේ වැඩසටහන් තුනක් කළා. විදුහල්පති තුමා මේ සඳහා අපට ධෛර්යය දුන්නා. අඩුපාඩු සොයා බැලුවා. මේ වැඩසටහන සඳහා විදුහල් කීපයක ළමයි එන්න සූදානමින් හිටියේ. නමුත් යුධමය වාතාවරණය නිසා දෙමාපියන් අකමැති වීමෙන් එය වැළැක්වුණා. අපි ආවම වැටහුණා මෙහෙ යුද්ධයක් නැති බව.

අප විවිධත්වය ගරු කරන සිසු පරපුරක් බිහි කරමු. අපේ ක්‍රිකට් කණ්ඩායම දිනවන්න අපි කවුරුත් කැමතියි. ඒකෙ විවිධ ජාතීන්ට, විවිධ ආගම්වලට අයත් අය ඉන්නවා. ඒ විදියට හැම ජන කොටසක් ගැන ම හිතනවා නම් ප්‍රශ්න විසඳාගන්න ලේසියි.



## ගමින් ගමට යා යුතු යි.

**උප පොලිස් පරීක්ෂකවරයෙක් - උඩහ පොලිසිය**

ජනවාර්ගික යුද්ධයට පෙර 35 කොලනියේ අපි හිටියේ. ජාතීන් දෙකක් වුනත් අපි හොඳට කතා බහ කළා ඇසුරු කළා. යුද්ධය නිසා තමයි අපට එන්න වුනේ. දෙමළ මිනිස්සු ම අපට කීවා කලබල ඇති වෙන්න යන්නේ, ජීවිතේ බේරා ගන්න කියලා. එහෙම සහෝදර බැඳීමක් තිබුණා.

අපි ශ්‍රී ලාංකිකයෝ, අපි ඉදිරියට යා යුතුයි. අපේ දූලා පුතාලා විවිධ බලවේග විසින් බේද බින්න කරන්න ඉඩ තියෙනවා. නමුත් අපට බෙදිල ඉන්න බෑ. මේ පළාතට ආපු ළමයින්ට වැටහෙනවා ඇති මේ ළමයි කුරිරු නැති බව. මනුස්සකම තියෙන කොට ජාති භේදයක් නෑ. දෙමළ ජාතියට හොඳ මනුස්සකමක් තියෙනවා. කලබල වෙලාවෙ දෙමළ මිනිස්සු ඇවිත් "ඔයාල කොහාට හරි යන්න. නැත්නම් ඔයාල මරයි කියල අපේ තාත්තාට කියපු හැටි මට අදටත් මතකයි."

දරුවන්ගේ හිත්වලින් ජාතිවාදී හැඟීම් අයින් කරන එක වැදගත් වැඩක්. රජය මුල් වෙලා මෙවැනි වැඩ සටහන් ගමින් ගමට ගෙන යා යුතුයි. නමුත් සමහරු කටයුතු කරන්නේ ගැටුම් වැඩි කිරීමට මිසක් අඩු කිරීමට නොවෙයි. එය කණගාටුදායක තත්ත්වයක්.



## නැති වූ සුහදත්වය

**කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ**

ජාතීන් අතර තිබූ සුහදත්වය නැති වුණා. මේ ප්‍රදේශයේ කටයුතු කරන නිලධාරීන් හැටියට මෙවැනි යහපත් කටයුත්තක් ඔස්සේ නැති වූ සුහදත්වය නැවත ඇති කිරීමට දායක වන්නට ලැබීම සතුටට කරුණක්. නුවරඑළියේ ළමයි එන්න සූදානමින් හිටියට අරන්තලාවේ ගැටුම්කාරී තත්ත්වය නිසා ඔවුන්ට එන්න බැරි වුනා. එය කණගාටුවට කරුණක්. ඒත් දුෂ්කරතාවලට මුහුණ දෙමින් මේ විදිහෙන් හරි, කඳවුර සංවිධානය කිරීම වැදගත් යයි මා සිතනවා.



## ඉදිරියට යන සම්බන්ධතා

**කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ**

අප විවිධත්වයට ගරු කළ යුතු ය. ඒ සඳහා විවිධ ජාතීන්ට අයත් දරුවන්ට අදහස් හුවමාරු කර ගන්නට අවස්ථාව ලබාදීම වැදගත්. එහෙත් මෙහි සාර්ථකත්වය රඳා පවතින්නේ මෙහිදී හඳුනාගත් දරුවන් තම සම්බන්ධතා කොපමණ දුරට පවත්වාගෙන යනවා ද යන කරුණ මතයි.



බ/සාරනියා විද්‍යාලයේ පැවති කඳවුර අවසානයේ මතක සටහන් තවත් සිසුවියකට ලබා දෙන කරගස්කඩ විද්‍යාලයේ සිසුවියක්

# සිසුන්ගේ අදහස්

## ආදර්ශ රැසක්

**ආර්. එම්. නවෝදා**



දෙමළ ළමයින්ගේ ජීවිතවලින් අපට ගත හැකි ආදර්ශ ගොඩක් තියෙනවා. ගෙදර දොරේ දුක් කරදර තිබුණත්, ඔවුන් ජීවිතයට මුහුණ දෙනවා.

## යුද්දෙට කැමති අයත් ඉන්නවා

**එම්.ඩී.සී. පුෂ්පකුමාර**



අපි මෙබඳු වැඩසටහන් ඔස්සේ සාර්ථක ශ්‍රී ලංකාවක් බිහිකර ගැනීමේ අඩිතාලම දැමිය යුතු යි.

යුද්ධවාදයේ විෂබීජ සිසුන්ගේ සිත්වලට ඇතුළු කිරීම නැවැත්විය යුතු ය. අපි යුද්දෙට කැමති නෑ. නමුත් ඒකට කැමති පිරිසකුත් රටේ ඉන්නවා. එතන තමයි ගැටලුව තියෙන්නේ.

## ආකල්ප වෙනසක්

**රොෂාන්**



මිනිස්සුන්ගේ ආකල්ප වෙනස් කිරීම සඳහා මෙවැනි වැඩසටහන් අවශ්‍යයි.

## ආත්ම ගණනක සම්බන්ධයක්

**සෙව්මිනි**

මට මීට පෙර දෙමළ මිත්‍රයො හිටියෙ නෑ. නමුත් මේ වැඩසටහන නිසා දෙමළ මිතුරු මිතුරියන් රැසක් ලැබුණා. මේ අවස්ථාව අපට ලබා දුන්නු බුද්ධි සර්ට ස්තූතියි. අපි නුවර එළිය වැඩසටහනට ගියා. එතනදී දෙමළ යාළුවෝ හම්බු වුනා. දෙමළ කියලා භේදයක් නෑ.



අපි ඉස්කෝල තුනකින් ගියා. අප සාදරයෙන් පිළිගත්තා. වෙනසක් කළේ නෑ. ආත්ම ගණනක් තිස්සේ හම්බුවෙලා තියෙනවා වගේ තමා දැනුණේ. කතා කළේ. ඔබලා එදා අපට මෙච්චර ළංවෙයි කියලා අපි හිතුවෙ නෑ. පස්සර විදුහලත් එක්ක විදුහල් දෙකක් එන්න නියමිත ව තිබුණා. අනික් අයට එන්න බැරි වුනා. නමුත් අප තනි නොකර පස්සර විදුහල ආවා.

ඇත්තෙන් ම අපට දුකයි. ඔබලා කොහොම හරි ආවා. අපේ රටේ උතුරු දකුණු ප්‍රශ්න තියනවා. අපට ඕනෑ තැනක යන්න බැහැ. ඇයි මෙහෙම උනේ. ඒත් අපි පුදුමාකාර විදියට ළංවුණා. අපේ ම නංගිලා මල්ලිලා බවට පත් වුණා. ලංකාව පුරාම ඉන්නෙ මගේම සහෝදර සහෝදරියො නේද කියලා මට හිතෙනවා.

## එකට සිටිය යුතුයි

**පුෂ්ප කුමාර**



අප සියලු දෙනා භේදයක් නැතුව එකට සිටිය යුතු ම ය. පස්සර දෙමළ විදුහලේ සිසුන් සමග එක්වීමෙන් අප ලැබූ අත්දැකීම් විශාලයි.

එක්කෙනෙක් වැටිල අඬන කොට අනෙක් හැමෝට ම දුකයි. එක් කෙනෙක් සතුටින් සිනාසෙන කොට අනෙක් අයටත් සතුටුයි. නැවත වතාවක් මේ වගේ එකතු වෙන්න ලැබෙයි කියලා ලොකු ප්‍රාර්ථනාවක් මගේ හිතේ තියෙනවා. ආයතනයකින් නොවුණත් පුද්ගලිකව හෝ මෙවැනි අවස්ථාව ලබාගත යුතු ය. ජාති භේදයකින් තොරව එක ම පවුලක සහෝදරයන් වගේ ඉන්න ලැබෙනවා නම් අපේ සතුට එයයි.

## අපේ සිත් පිවිතුරුයි

**මංජුලා දමයන්ති**



දැන් අපට බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්ක දෙකේ ම යාලුවෝ ඉන්නවා. ඕනෑම දෙයක දී අපට මුණ ගැහෙන්න පුලුවන්. අපේ සිත් තවම දූෂණය වෙලා නෑ. දැන් ඉන්න වැඩිහිටියන්ගේ ආකල්ප හදන එක ඉතාම අමාරුයි. නමුත් අපේ වයසේ අයගේ ආකල්ප හදන එක ලේසියි.

ජාති හා ආගම් අනුව බෙදා තිබුණත්, අපි කවුරුත් එකයි කියන ආකල්පය මේ වැඩසටහන නිසා අප තුළ ඇති වුණා.



මහ/ කරගස්කඩ ම.වි. කඳවුරේ දවසේ ආරම්භය සනිටුහන් කරමින් ව්‍යායාමයේ යෙදෙන සිසු සිසුවියන්.

# මහනුවර කරගස්කඩ පාසල් කඳවුර



## එක අම්මගෙ දරුවෝ

විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මහජන සම්බන්ධතා ලේකම්
**මුජාබ්ඩීන්**

සිංහල දෙමළ මුස්ලිම් යන අප කවුරුත් එක අම්මගෙ දරුවෝ. ඈත අතීතයේ සිට අපේ සිංහල රජ පරපුර, රටේ ආරක්ෂාව තහවුරු කරමින් යහපත් පාලනයක් ගෙ ගිය නමුත් වර්තමානය වන විට අපේ රට භේද බින්න වෙලා. විශාල යුද්ධයක පැටලිලා. මගේ වාසගමේ තැන්නෙවලව්ව නමින් සිංහල වාසගමක කොටසක් තියනවා. මේක අවුරුදු 400 ක් විතර පරණයි. මුස්ලිම් අය හැටියට අපි සිංහල ජනයා සමඟ යහපත් සහජීවනයකින් ජීවත් වන්නේ, එනිසා අප ගැටුම්කාරී දේවල් අනුමත කරන්නේ නෑ.



## සහජීවනය නැති වුණා.

**ප්‍රා. සභාපති සමන්**

මීට කලින් මේ විදුහලේ මුස්ලිම් හා දෙමල දෙපිරිසම ඉගෙන ගත්තා. නමුත් දැන් ඒ තත්ත්වය වෙනස් වෙලා. අතීතයේ තිබ්බ බැඳීම් වෙනස්වෙලා. ඩී.එස්.සේනානායක නිදහසේ පණිවුඩය අරං ලංකාවට එනකොට එතුමා කැඳවාගෙන ආවේ පොන්නම්බලන් රාමනාදන්, වැඩියෙන් ම සතුටු උනේ ඒ අය, නමුත් අද නිදහස භුක්ති විඳින්නේ දකුණේ අය පමණයි. සිංහලේ අන්තිම රජ්ජුරුවෝ ඇත්ත නම කන්දසාමි රාජේදුරෙයි. නමුත් සිංහලයෝ ඔහුව තමන්ගෙ රජ්ජුරුවෝ හැටියට පිළිගත්තා. මේ විදිහට ඉතිහාසය පුරාම අපි සහජීවනයෙන් ඉඳලා තියනවා. ඒක වෙනස් වෙච්ච එක කණගාටුවට කරුණක්. හැබැයි මෙවැනි වැඩ සටහන් නිසා සමාජයට අලුත් පණිඩුයක් ලැබෙනවා.



## නැතී වී ගිය වටිනාකම

**ආචාර්ය වී. අමීර්දීන් මහතා**

මගේ නම වෙල්ලතම්බි අමීරදීන් මීට පෙර කියවුණා සිංහල මුස්ලිම් සබඳතා ගැන මම කියන්නේ මුස්ලිම් දෙමළ සබඳතා ගැන. උතුරු නැගෙනහිර මිත්‍රත්වයට දැන් මොකද වෙලා තියෙන්නේ?

අප, අප අතරින් ම නැති වූ වටිනා දෙයක් සොයමින් සිටිනවා. නිදහස් සැමරුවක් කෝ අපට නිදහසක්? කෝ නිදහස් සටනක්. මෙයට උත්තර ඔබම සෙවිය යුතු යි.

අද අපි දමපු පදනම අනාගත නායකයන් වශයෙන් ඔබ විසින් ශක්තිමත් කළ යුතු ය.




මහ/ කරගස්කඩ ම.වි. පැවති කඳවුර අතරතුර සුහද පිළිසඳරක යෙදී සිටින ශිෂ්‍යාවන් පිරිසක්



කු/හින්දු දෙමළ ම.වි. කඳවුරේ ක්ෂේත්‍ර චාරිකාව අතරතුර ගොයම් කැපීමේ අත්දැකීම බෙදා හදාගන්නා සිසු සිසුවියන් පිරිසක්

# කුරුණෑගල හින්දු දෙමළ විද්‍යාලය කඳවුර



## යුගයේ අවශ්‍යතාවක්

වයඹ යෞවන කටයුතු ඇමති
**නිරංජන් වික්‍රමසිංහ**

මෙවැනි වැඩ සටහනක් දියත් කිරීම යුගයේ අවශ්‍යතාවකි. අද මෙරට ඇති වී තිබෙන තත්වය අනුව මෙ වැනි වැඩ සටහන් වඩ වඩා අවශ්‍ය වේ. මේවා විවිධ කෝණවලින් බලන්නට පුලුවන්. ඕනෑම හොඳ කටයුත්තක දී එ වැනි ගැටලු ඇති විය හැකි යි. හෘදය සාක්ෂියට එකඟ ව කටයුතු කරනවා නම් එ වැනි අභියෝග ජයගත හැකියි.

මුස්ලිම්, සිංහල හා දෙමළ දරුවන් මේ විදියට දින තුනක් අන්‍යොන්‍ය සමගියෙන් වැඩ කටයුතු බෙදා හදාගෙන එකට ජීවත්වීම විශේෂ සිද්ධියක්. පළාත් සභාවේ යෞවන කටයුතු ඇමතිවරයා හැටියට මෙය අලුත් අත්දැකීමක් නො වේ.  මා ජීවත්වන ප්‍රදේශයේ දෙමළ වතුකම්කරුවන්, මුස්ලිම්වරුන් හා සිංහල ජනතාව සහයෝගයෙන් ජීවත් වනවා. කිසිම ප්‍රශ්නයක් ඇති කරගෙන නෑ. අද තියන ජනවාර්ගික ප්‍රශ්නය මීට පෙර විසඳාගත යුතු ව තිබුණා. නමුත් ඒ සඳහා හරි අවබෝධයකින් කටයුතු කර නැති නිසා තමයි යුද්ධමය තත්වයක් රට තුළ ඇති වුණේ. මෙය විසඳිය හැක්කේ දේශපාලන විසඳුමක් ලබාදීමෙන් පමණයි.



මහ/හරිස්චන්ද්‍ර ම.වි. කඳවුරේ ක්ෂේත්‍ර චාරිකාවක නියැලෙන ආරාධිත පස්සර දෙ.ම.වි. සිසුන් පිරිසක්

# අනුරාධපුර වලිසිංහ හරිශ්චන්ද්‍ර විදුහලේ කඳවුර



## විවිධත්වය ඉවසීමෙන් එක්සත් ශ්‍රී ලංකාවක්

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු**

මේ විදුහල්වල සිසුන් අතරේ ශක්තිමත් බැඳීමක් ඇති වී තිබෙන බව මා දුටුවා. මේ බැඳීම අදට පමණක් නොව දිගටම පැවතිය යුතු ය. විවිධත්වයට ගරු කරන හැටි ඔබ හඳුනාගත්තා. මේ ගුණය හැම තැනම ගෙනියන්න ඕනෑ. එහෙම වුණොත් විවිධත්වයට ගරු කරන එක්සත් ශ්‍රී ලංකාවක් බිහිකර ගැනීම සඳහා පදනමක් ඇති වේවි.



## පස්සර දෙමළ මහා විදුහලේ විදුහල්පති

යම්කිසි කාර්යයක් පටන් ගන්නවා නම් එය කළ යුත්තේ පාසැලෙන් බවට නැපෝලියන් බොනපාට් ප්‍රකාශ කළා. මේ කඳවුර හාරහා සිසු දරුවන්ට යුද්ධයේ බිහිසුණු බව පිළිබඳ අවබෝධයක් ලැබී තිබෙනවා. එටේ දුප්පත්කමත් යුධ බියත් නැති කළ හැක්කේ කුඩා අවධියේ සිට උසස් මනසක් ඇති කළොත් පමණයි.

සීත කඳු මුදුනින් රූරා හැලෙන දිය දහර අතු ගංගා ඔස්සේ ගලා ගොස් මහා ගංගාවක් ව තැනි බිම් හරහා පිය මැන මහ සයුරට පිවිසෙයි. රජරට, වියළි බිමෙහි රන් අස්වනු පීදෙන්නේ මේ නිල් දියවරිනි. කඳුකරයේ සීතල හදවත් සහ රජරට උණුහුම් හදවත් අතර හූ රේඛා ඔස්සේ වැටී ඇති මිත්‍රත්වයේ පාලම, ජීවමාන යථාර්ථයක් බවට පත් වූ දවසක් උදා විය.

ඒ ශිෂ්‍ය හුවමාරු වැඩ සටහන අනුරාධපුර වලිසිංහ හරිස්චන්ද්‍ර විදුහලට සපැමිණි මොහොතයි. එදින සැඳෑවෙහි අනුරාධපුර වලිසිංහ හරිශ්චන්ද්‍ර විදුහලෙහි දහසක් දෑස් බලාපොරොත්තුවලින් ප්‍රමුදිතව සිටි මොහොතක පස්සර දමිළ මහා විද්‍යාලයේ සහ ලුණුගල ශ්‍රී රාම ක්‍රිෂ්ණා විද්‍යාලයේ දරු දැරියනුත් ගුරු මණ්ඩලයේ සාමාජික සාමාජිකාවෝත් විදුහල් භූමියට පැමිණියහ.

ජාතික ධජය, සාමාජීය කේන්ද්‍රයේ ධජය හා අන්තර වාර්ගික ශිෂ්‍ය හුවමාරු වැඩසටහනේ ධජය එසවීමෙන් අනතුරුව, වලිසිංහ හරිස්චන්ද්‍ර විදුහලේ සිසුන් විසින් ආගන්තුක සිසුන් පිළිගන්නා ලදී.

ආගමික අනුශාසනාවලින් අනතුරුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් ඒකකයේ අංශ ප්‍රධානී ලයනල් ගුරුගේ මහතා විසින් වැඩසටහනේ අරමුණ පැහැදිලි කරන ලදී.

අනුරාධපුර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමියගේත් සාම දීම සමාජ කේන්ද්‍රයේ සභාපති නිශාන්ත රාමනායක මහතාගේ ස්තුති කතාවෙන් අනතුරුව ළමා සිනමාපටයක් නැරඹීමේ භාර ගැනීමේ අවස්ථාව දරුවන්ට උදා විය.

දෙවැනි දින වැඩ මුළුව ආරම්භ වූයේ සුපුරුදු ලෙස ශාරීරික සුවතා වැඩසටහනෙනි. උදෑසන ආහාර ගැනීමෙන් පසුව ක්ෂේත්‍ර චාරිකා ආරම්භ විය. ඒ අනුව කුකුළෑව, රොට වැව, කටු පොත, අශෝක පුර හා රඹෑව පාර, යාය දෙක යන පුදේශවලට ගොස් එහි ජන ජීවිතය නිරීක්ෂණය කිරීමට ශිෂ්‍ය කණ්ඩායම්වලට හැකි විය.

නැවත විදුහලට පැමිණීමෙන් අනතුරුව දිවා ආහාරයෙන් පසුව උදා වූයේ ජනශ්‍රැති පර්යේෂක ගුණසේකර ගුණසෝම මහතාගේ මූලිකත්වයෙන් ඉදිරිපත් කෙරුණු ජන ශ්‍රැති අධ්‍යයනය ඔස්සේ විවිධත්වය හඳුනා ගැනීමේ වැඩසටහන යි.

නිර්මාණ කුසලතා ඇති සිසු සිසුවියන් තිස් දෙනෙකුට පමණ පුවත් හසුනක් (A News Letter) නිර්මාණය කිරීම පිළිබඳ කෙටි වැඩමුළුවක් ඉන් අනතුරුව පැවැත්විණ. සී. දොඩංවත්ත, රසික මනෝබුද්ධි සහ රවී චන්ද්‍රලාල් යන මාධ්‍යවේදීන් විසින් මේ වැඩමුළුව මෙහෙයවන ලදී.

ඉන්පසු ප.ව. 2.30 ට පමණ විවිධ ක්‍රීඩා ඉසව්වලට සහභාගි වීමේ අවස්ථාව දරු දැරියන්ට ලැබිණ.

ක්‍රීඩා කිරීමෙන් වෙහෙස වූ ගත සිත නිවා සනසා ගැනීමේ මගෙක් වූයේ නුවර වැවේ දියනාන්නට ඔවුනට ලැබුණු අවස්ථාවයි. ප.ව. 6.30 ට පමණ සංස්කෘතික සන්දර්ශනය ආරම්භ විය. ඒ සඳහා සහභාගි වීමට පැමිණි විශේෂ ආරාධිත අමුත්තන් ප්‍රධාන ශාලාව වෙත කැඳවා ගෙන ඒම කෙරුණේ විද්‍යාලයීය තූර්ය වාදක කණ්ඩායමේ සහභාගීත්වයෙනි.

කඳවුරට සහභාගි වූ සියලු පාසැල්වල දරු දැරියන්ගේ කලා කුසලතා ඉදිරිපත් කිරීමට මෙය හොඳ අවස්ථාවක් විය.

කඳවුරේ තෙවැනි දින ආරම්භ වූයේ ද ශාරීරික සුවතා වැඩසටහනෙනි. ඉන් අනතුරුව ක්ෂේත්‍ර චාරිකාවල සටහන් තැබීම, සිසුන් අතින් සිදු කෙරිණ. සංකේත පැළ සිටුවීමෙන් පසුව සියලු දෙනා ප්‍රධාන ශාලාවට රැස් වූහ. ශිෂ්‍ය කණ්ඩායම් තම ක්ෂේත්‍ර අත්දැකීම් හා නිරීක්ෂණ ඉදිරිපත් කළ හ.

තෙදින කඳවුරේ අවසාන අදියර එළඹිණ. කෙටි අනුශාසනා කිහිපයකින් අනතුරුව සිංහල හා දෙමළ භාෂා දෙකින් ම ජාතික ගීය ගයනු ලැබිණ. කඳවුරේ වැඩ කටයුතු අවසන් විය.



විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය



## උදාර වැඩසටහනක්

**හරිශ්චන්ද්‍ර විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිනිය**

මෙවැනි උදාර වැඩසටහනක් අපේ විදුහලට ලැබුණේ සිංහල අංශය බාර විපුල තිලකරත්න මහතාගේ මැදිහත්වීම නිසයි. මම දැන් විශ්‍රාම යන්න ළඟයි. මේ වගේ උසස් වැඩසටහනක් මීට පෙර මට කරන්න බැරි උනේ ඇයි කියන වේදනාව මට තියනවා. නමුත් මෙ අයුරින් හරි දායකවන්න ලැබීම සතුටක්.

නුඹයි අපේ ලොව දුවේ පුතේ
හිරුත් සඳුත් අප ඔබ ම වෙතේ
නැණ ගුණ දම් නිති වඩනු සිතේ
නැතොත් අපට හෙට දිනක් නැතේ



## සහෝදරත්වයේ බැඳීම

**නිසංකා දුලංජලී**

අනුරාධපුර වලිසිංහ හරිස්චන්ද්‍ර විද්‍යාලය

දෙමළ සහෝදර සහොදරියන් අප හද පිරි සෙනෙහසින් පිළිගන්නවා. මේ හැඟීම වචනයෙන් විස්තර කරන්න අමාරුයි. බදුල්ල ප්‍රදේශයේ ජන ජීවිතය ගැන අප මීට පෙර දැන ගෙන සිටියේ නැහැ. දැනගන්නට ලැබුණේ මේ වැඩසටහන නිසයි. වතුකරයේ ලැයිම් කාමරවල ජීවත්වන ජනතාව විඳින හිරිහැර ගැන අපට දුකයි. අපි ඒ දුක අපේ දුක බවට පත්කර ගත්ත.

වතුකරයේ සිට ඔබ අපේ විදුහලට ආ එක කොච්චර සුන්දර අත්දැකීමක් ද? බදුල්ලේ සිට ඔබ ගත කරන දුෂ්කර ජීවිතයට සමාන දුෂ්කර ජීවිතයක් නුවර කලාවියේ ජනතාව ද ගත කරන බව අපේ ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී අප දුටුවා. පස්සර වතුවල ජනතාවට බට ලයින් දීලා තිබුණාට වතුර නෑ. ඒත් නුවර කලාවියේ අපි දැකපු ගම්මානවල අයට බටත් නෑ. වතුරත් නෑ. ඒ අය වතුර හොයාගෙන හැතැප්ම ගණන් පයින් යනවා. ළමයින්ට ඉස්කෝලෙ යන්න පහසුකම් නෑ. දෙමාපියන්ට හරියට රැකියාවක් නෑ.

ඔබලාට නං බලාපොරොත්තවක් තියනවා. මේ අයට ඒකත් නෑ. යුද්ධයෙනුත් බැට කනවා. මේ නිසා, අප අතරේ ඇති වුණු සහෝදර බැඳීම මේ සියලු කටුක අත්දැකීම් මැද්දේ බොහෝ කලක් පවතීවා යන්න මගේ පැතුමයි.



අනුරාධපුරයේ කුකුළෑව නැමති ගමේ ක්ෂේත්‍ර චාරිකාවක නැයැලෙන සිසු සිසුවියන් පිරිසක්




අනු/ සහිරා විද්‍යාලයේ පැවති කඳවුරේ සංස්කෘතික සංදර්ශනය වර්නවත් කරන සිසුවියන් පිරිසක්

# අනුරාධපුර සහිරා විදුහල් කඳවුර



## උසස් වැඩසටහනක්

**උතුරු මැද මහ ඇමති බර්ටි ප්‍රේමලාල් දිසානායක**

උතුරු මැද පළාතේ අධ්‍යාපන ඇමතිවරයා හැටියට, සිංහල, දෙමළ, මුස්ලිම්, වශයෙන් ජාතීන් තුනට ම අදාළ සිසු දරුවන්ට යහපත් අධ්‍යාපනයක් ලබාදීම මගේ වගකීමයි. එහි දී මේ හැමෝම සමාන හැටියට සලකල යි මා කටයුතු කරන්නේ,

මේ සිසුන්ට තම අත්දැකීම් හුවමාරු කර ගන්න, අන්‍යෝන්‍ය සහජීවනය ඇති කරගන්න ලැබුණු මේ අවස්ථාව ඔවුන් ලද ඉමහත් භාග්‍යයක් හැටියටයි මං සලකන්නේත ඒ නිසා, මේ වැඩසටහනට මගේ ආශිර්වාදය පිරිනමනවා.

# කැටපත් පවුර

## සුන්දරයි

කඳුකර ජීවිතය දුෂ්කරයි
අප ලැබූ දැනුම ඉහළයි
**K.C.C. Boys**

## පැතුම

ජීවත්වන්න ආසයි
සැමදා මේ ලෙස
**K.C.C.**

## නොමැකෙන මතකය

දමිළ මිතුරනි
දැනුණි ඔබගේ
දයාබර බව
නොමැකේවි මතකයෙන්
මේ ගත වූ තෙදින
**සුනිල් K.C.C.**



මිත්‍රත්වයේ සනිටුහන් එක් කරමින්

## සාදාකාලික සාමය

රුදුරු යුද ගිනි නිවා
සදාකාලික සාමයක් පතමු.
වජිරා
**12 කලා K.C.C.**

## අහසේ තරු සේ

සයුරේ රළ සේ
මිතු දම් පවතී
ලොව සැමදා
**සමන් K.C.C.**

## බදුල්ල සර්නියා විදුහල

සීතල සුළඟ මන්ද මාරුතය හා
ගැටී එන විට කුරුළු ගී නාද
දෙසවන ගැටෙන විට
එක යායක පිපුනු මල් යායක් සේ



කැටපත් පවුරට අදහස් දෙමින්

# කැටපත් පවුර

දිදුලමින් එකට හිඳ
මොහොතින් මොහොත ගෙවන
මේ කඳවුරු ජීවිතය
මොන තරම් සුන්දර ද?
හමු වූ මිතුරු මිතුරියන්
සටහන්ව ඇත හදවතේ
සදා බැඳුණි මිතුදමින්

## පරවි රෑන

භේදයකින් තොරව
පරවි රෑනක් සේ පියාසර කරමු
**K.C.C.**

## ගංගාවක්

ඉමක් නැති ගංගාවක් සේ
එකට ගලා යමු...
K.C.C. Boys

## වගකීම

සමගිය බලය වේ.
එය සුරැකීම අපගේ වගකීමයි
**ලක්මාලි.**
(MO/B/S/K/V)

## එකම මග

පිපෙන්නට වෙර දරන
මල් කැකුළු වන් අපට
ජාති භේද රකුසාගෙන්
ගැලවීමට
ඇති එකම මග
සාම මාවතේ
පියවරින් පියවර
ඉදිරියට යෑමයි
**නිලුකා**
මොනරාගල මැදි මහ විදුහල



අ/වලිසිංහ හරිශ්චන්ද්‍ර විදුහලේ දී නිර්මාණයක් එක් කරමින්



සහෝදර ප්‍රේමයෙන් කැටපත් පවුරට සටහනක්

# කැටපත් පවුර

## පරාජිතයෝ

යුද්ධය නිසා
දමිළ සොයුරු සොයුරියන්ගේ
ජීවිත අහිමි වී නම්
සිහල සොයුරු සොයුරියන්ගේ
ජීවිත අහිමි වේ නම්
එය ඔවුන්ගේ ජයග්‍රහණයක් ද
නැත...
මිය යන්නේ
ශ්‍රී ලාංකීය සොයුරු සොයුරියන් නොවේද?
එසේ නම් අප සියලු දෙන
පරාජිතයන් නොවේ ද?



කැටපත් පවුරට අදහස් ගොනු කරන සිසුවියක්

## සුවඳ

සුපිපි කුසුමක් එක්ව
සුවඳ විහිදයි
ලොව පුරා
**සුජානි, උපේක්ෂා, අයේෂනී**
10-2

## වසන්තය

ඉඩෝරය පැමිණ,
ජීවිතය
වසන්තය
පැහැරගෙන
කඩෝර දුක්ගිනි ඇවිළී ඇතත්
මුවට හසරැල්ලක්
ජීවිතයට නවෝදයක්
ලැබිණ, අප හමුවෙන්

**සිරිදරන් ප්‍රදීප්**
**මනෝ ලෝගා**
4 වසර
P.I.M.V (N.S)



සමුගැනීමට පෙර

# කැටපත් පවුර

## පියරවක්

කුරිරු වූ යුද්ධයේ ගිනි සිළුව නැඟෙන විට
සත්තමයි ගිනි ගනී පුංචි අප සිත් දැහැන
දමිළ සිංහල ජාති වෙන් කොට
කිම ද ගිනි ඇවුළුණේ මෙලෙසට
යළිත් මේ බිම සනසවන්නට
තබන්නෙමු පියවරක් අප හැම
**දර්ශිකා සුදර්ශනී**
**කුසුම් කල්හාරි**
**දිනිෂා රෝෂිණී**
12 වසර
උහන මහ විදුහල - අම්පාර

## බබලවමු

අතීතය වේදනා බර කඳුළක් උනේ
ජාති භේදයෙන් සටන් කළ නිසයි
ඒ අතීතය අතීතයට ම බාර දී
වර්තමානය බබලවන්නෙමු
**ජනක තුසිත බණ්ඩාර**
අම්/ ගලහිටියාගොඩ මහ විදුහල

## කඳුකර සීත

මැදියම් රැයේ වැටෙන සඳඑළිය
උතුරත්, දකුණත්, කඳුකරයත් මායිම් නොකරයි
ගත සනහා හමන මඳ පවන
ජාති භේදය නොතකයි
වැටෙන කඳුකර සීත දිය ඇලි
උස් පහත් මිටි භේද නොතකයි.
සොබා දහම අප කාටත් පොදුයි
සුළඟ සේ හමා යමු.
සඳ එළිය සේ සිසිල දෙමු.
අවි ලෙලවන යුගය
අවසන් කරමු.
**චන්දන පුෂ්ප කුමාර**
අම්/ උහන මහා විද්‍යාලය



බ/සාර්නියා විදුහලේ දී කැටපත් පවුර අරලංකාරවත් කරන සිසුවියක්

# කැටපත් පවුර

## මිලින නොවේ

සීත උයනක පිපුණු මල්
සොයා ආ ගමනේ
සිතට මෙතුවක්
නොලැබුණු සෙනෙහස
ඔබගෙන් මට ලැබුණේ
අහස විනිවිද
කඳවුරු බැඳගෙන
දින දෙකක් ම ගෙවුනේ
ඉතින් මා හට යන්න අවසර
සොයුරු සොයුරියනේ
ඔබේ සෙනෙහස
මගේ හද තුළ
සදා රැඳේ
කිසිදා මිළින නොවේ.

**අනුෂා නිලෝමි**
අම්/ රජගලතැන්න ම.විදුහල



සමුගැනීමට පෙර මතක සනිටුහන් කරමින්

## දිවි කඳුර

සිතන පතන හැම පැතුම ම
නොසිතු ලෙසින්
මිලින උනේ
මුවට නැගෙන සිනාරැල්ල
ජීවිතයට කඳුල උනේ
අවිහිංසක ඔබෙ හදවත
පිවිතුරු නම් හැමදාමත්
සිනාසෙන්න කඳුළ මැදින්
වරදින් නෑ කවදාවත්

**ජී.කේ ඉන්දිකා කුමුදුනී.**
අම්/ උහන මහ විදුහල

## සතුට

මහ මෙර වඩා බලගතු
මහ සයුර පවා පරදන
ඔබෙ සෙනෙහස හද විලේ පිපුණා
දමිළ සොයුරන්ගේත්
සිහල සොයුරන්ගේත්
ලෙන්ගතු බව දැක
හිස් අහස ද
සතුටු කඳුළු හෙළුවා

**චන්දන පුෂ්ප කුමාර**
අම්/ උහන මහා විද්‍යාලය



# කැටපත් පවුර

ඇති වන එක නොවේ නෑකම
පැරණි නොවේ මිත්‍රත්වය
දුර සිට පැමිණි
වසන්ත කාලය අපි
**නන්දනී - නෝර්වුඩ් විදුහල**

ඔබ සතුටින් ජීවත්වන්න නම්
එකමුතු වන්න
**යෂිදරන්**

මම ඉල්ලන දේ ඔබ දෙන්න කැමති ද?
ඔබ ඉල්ලන දේ මම දෙන්න කැමති ද?
මම ඉල්ලන්නේ සාමය
ඔබෙන් මට එය ලැබෙයි ද?
**නෂ්ලියා - බිලුම්ෆීල්ඩ් විදුහල**

බොහෝ කලක් පැවති
මිත්‍රත්වයන් කැඩී ගිය ද
කෙටි කලකින් ඇති වූ
මේ බැඳීම
කොතෙක් කල් රැඳේවි ද?
**එස්. පද්මා, බිලුම්ෆීල්ඩ්**

වසන්ත කල පිපිණු
මල් වැනි අප කවදත්
විනාශ නොවී
පර නොවී ඉඳිමු
**සුබා - ගනේෂන්**

ඔබ සාමය සෙවිය යුතුයි
සාමය ඔබ සොයන්නේ නැත.
**යෝගේන්ද්‍රන් - දෙමළ විදුහල**
සාමය අපේ සුසුමක් වේ
එසේ නොවුනහොත් අප මියයාවි
**ජී. ලෝකා**



අනුන්ට දෙන
අපත් ලබන
ආදරය
අනුන් නොදෙන
අප ළඟත් නැති සාමය
**ඇන්ටන්**

සියලු සිත්වල
ආදරය ඇති වුණොත්
සාමය ඇති වේවි.
**එස්. ජුලි**

කොහාට මිහිරි හඬක් දුන්නේ
කවුදැයි නොදනිමි
මට සාමය හඳුන්වා දුන්නේ
සාරනියාව යි
**යෝගරාජා**





# සෙනෙහස

කඳු මුදුනේ
සේද වලාවෙන් වට වූ
සුන්දර මේ රමණීය ගමේ
සිහිල් සුළං ගත දැවටෙමින්
ගත කළ දිනයේ
දුටුවෙමි
මිහිරියාව ජීවිතයේ
හමු වූ විට, යහලු යෙහළි පිරිවර
බැඳුණි ආදරයෙන්
සාමය, සමගිය බලය විය
අප බැඳුමට
අවි බල පරයා
සෙනෙහස පිබිදේ

**අනුරපුර වලිසිංහ හරිශ්චන්ද්‍ර විදුහලේ සිසුවෙක්**

# විවිධත්වය අගයමු

සිංහල දෙමළ සංස්කෘතික සබඳතා ජනශ්‍රැති පර්යේෂක
**ගුණසේකර ගුණසෝම**

විවිධත්වය යනු නිරතුරු අගය කළ යුතු හා ඉවසිය යුතු අපූරු සංකල්පයකි. ස්වභාව ධර්මයේ සේ ම ජන සමාජයේ ද විවිධාකාර වූ වෙනස්කම් දක්නට ලැබේ. විවිධත්වය බැහැර කරන්නා හට සමාජ පැවැත්මක් නොමැත. වර්ධනය කර ගත යුතු උතුරු ආකල්ප ද නොවේ. පානම්පත්තුව යනු අන්තර් සංස්කෘතික සබඳතා විෂයෙහි ආදර්ශවත් කලාපයකි. මෑත කාලීන ව එම සබඳතා බිඳී ගිය ද ජාතීන් කිහිපයක් මිශ්‍ර වී සහජීවනයෙන් ජීවත් වූ ප්‍රදේශයකි. සිංහල හා දෙමළ භාෂා දෙකම උච්චාරණය කිරීමේ හැකියාව එහි විසූ සිංහල, දෙමළ හා මුස්ලිම් කා හටත් තිබිණ. ආදර්ශවත් මානව සබඳතා එහි පැවතිණ. සංස්කෘතික හරයන් ආරක්ෂා කිරීමෙහිලා විශේෂ කැපවීමක් ඔවුනට විය. එහෙත් 1983 කළු ජූලියේ දී ඇති වූ අවාසනාවන්ත තත්වය නිසා මෙය වෙනස් විය. යහපත් සිතුවිලි නැති විය.